2021 සැප්තැම්බර්
03 කාණ්ඩය 06 කලාපය
ISSN 25792369
ආධාරය රු:50/-

# FORWARD®

## සටන් කරන කාරුණ්‍යයට











# උඹට ඇහුනද, මම කිව්ව හැමදේම?

පාංශුකූලයක් නොතියාම, අවසන් කැමැත්තත් ඉටුනොකරගෙනම යන්න වුනේ කාටවත් නොකියාම.. තවත් කලක් හිටියනම් ලෙඩක් දුකක් නොහැදීම, උඹ දණ නොගසාවී මිණී පුලුස්සන බිම ඔහොම..

උඹේ දුකටත් වැඩිය මම හිතුවේ මිනීමරු උන්ගේ හිනාව ගැන. ඇත්තටම මම මැරුණා නෙවේ උන් මාව මැරුවා, උඹට දුකක් දෙන්නම හිතාගෙන!.. ඇහැට නොපෙනී ලෙඩ කරන වෛරසයටත් වඩා මට සටන් කරන්න උනේ බලය වෙනුවෙන් මානුෂීය හැඟීම් මරාදාලා, මිනිස් ජීවිතවලට වඩා තමන්ගේ ධනය, බලය දිහා හැමවෙලාවෙම කෑදරකමින් බලා සිටිය මිනීමරුවෝ ටිකක් එක්ක.

උන් එක්ක තනියම මට සටන්කරන්න බැරිවුණා, සමාවෙයන් ආයෙමත් මගේ මැණික!. දැන් ඇති ඇඬුවා. නැගිටලා පලයන්, මිනීමරුවෝ මෙල්ලකරන්න පුළුවන් අවි හදන්න උත්සහ කරන උන් හොයාගෙන!!. උඹට කළහැකි දෙයක් ඇති උන් ගාව. මගේ දරුවොවත් මන් වගේ මරානොගන්න උඹට ඉතුරුවෙලා තියෙන්නේ ඒකමයි මගේ මැණික.

දැන් මේ පොළොව උනත් ඉල්ලන්නේ අළුත් වැස්සක් හොඳටෝම තෙමෙන්න!!..

# ජීවිතයේ අඳුරු අහුමුළු දිගේ ආලෝකය හඹා ගිය සොඳුරු විප්ලවවාදියා...

## චන්ද්‍රකුමාර වික්‍රමරත්න සහෝදරයා ගැන බිඳක්...

වානේ පන්නරයේ ඉන්න පාවෙල් වගේම ඔහුත් අපේ හිත් බොහොම තදින් අල්ලලා පොළවේ ගහනවා වගෙයි දැනෙන්නේ. ඔහුගේ ජීවිතය ගැන තොරතුරු බොහොම අල්පයි. බොහෝ විට නැති තරම්. අඩුම තරමේ ඔහු මිය ගිය විදියක්, තැනක් හෝ දිනයක්වත් අප දන්නේ නැහැ. ඔහුගේ ජීවිතය හා බැඳුණු බොහෝ කාරණා සේම ඒ විසල් හදවතෙහි ගැබ්ව තිබූ මානව ප්‍රේමය පිළිබඳවත් අපට තේරුම් ගත හැකි එකම සහ කදිම සාක්ෂ්‍යයන් වන්නේ ඔහුගේ සාහිත්‍ය නිර්මාණයි. "භූගත කවිසිත" කියලා කියන්නේ ඒ සුන්දර මනුස්ස ආත්මය එක්තැන් කළ ලිඛිත සාක්ෂියයි.

1964 දී විතර ගාල්ලෙ අහංගමදී ඉපදුණු චන්ද්‍රකුමාර සහෝදරයාට කුඩා කාලයේදීම මාපිය සෙනෙහස අහිමි වෙනවා. පියා පවුල හැර යාමෙන් පස්සෙ චන්ද්‍රකුමාර සහෝදරයගෙ අම්මට සිද්ධ වෙනවා තමන්ගෙ දරුවන්ව ජීවත් කරවන්න නොවිඳිනා දුක් විඳින්න. අවසානෙදි ඒ අම්මා තමන්වම විකුණනවා. මනුස්සයෙක්ට විඳින්න පුළුවන් නින්දා, වේදනාවන්



සියල්ලම විඳලා අන්තිමේදි ඇය සිය ජීවිතයෙන් සමුගන්නවා. චන්ද්‍රකුමාර සහෝදරයට එතකොටත් යාන්තම් වයස දහයක් හෝ එකොළහක් විතරයි. ඒ වුණත් ඒ වෙනකොටත් ඔහු වැඩිහිටියෙක්ටවත් දරාගන්න බැරි තරමේ අපහාස, බඩගිනි, වේදනා සහ නොසලකාහැරීම් වැනි අමිහිරි අත්දැකීම් රාශියක් පිරුණු ජීවිතයක් ගෙවමිනුයි හිටියේ.

ජීවිතයේ විවිධ අවස්ථාවලදි තැඹිලි විකුණමින්, දුම්රියේ ගීත ගයමින් හා තවත් විටෙක කම්කරුවෙක් ලෙස මහා අපාගත ජීවිතයක් ගෙවමින් ඔහු ජීවන සටනක නියැලුනා. මේ හැම දෙයක් තුළින්ම ඔහු ජීවිතයට අත්දැකීම් එකතු කරගනු ලැබුවා. සමාජය ගැනත්, ඒ තුළ පිරී පවතින අසාධාරණය හා අයුක්තිය ගැනත් ඔහු ඉගෙනගත්තා. මේ සියලු අත්දැකීම් හේතුවෙන් කුඩා කල පටන්ම තමාව පෙළනු ලැබූ අය ගැන ඔහුගේ හිතේ වෛරයක් ඇවිළෙමින් තිබුණා.

එහෙත් 1974දී පොල්වත්තේ ආරියචන්ද්‍ර නමින් පැවිදි වීමෙන් අනතුරුව ඔහුගේ ජීවිතය වෙනස් මානයකට පිවිසියා. ලොකු හාමුදුරුවන්ගේ මඟ පෙන්වීමෙන් පොතපත කියවීමට හා ලිවීමට උගැනීමටත් සාහිත්‍යයකරණයටත් ඔහු නැඹුරු වුණා.

පසුකාලීනව උපැවදි වීමෙන් අනතුරුව නැවතත් 1982 දී ඔහුට මුණගැහෙන යම් නොදන්නා සගයෙකු විසින් ඔහුව දේශපාලන දැනුමින් සන්නද්ධ කරවනවා. මෙයයි ඔහුගේ ජීවිතයේ දෙවැනි හැරවුම වූයේ. ජීවිතයේ එක් මොහොතකදී තමන්ට ජීවිතය එපා කරවූ සමාජයට වෛර කළ ඔහු තමන් වැනිම පීඩිත ජනතාවට අසීමිත ලෙස ප්‍රේම කරනු ලබනවා. ඒ ප්‍රේමය පෙරදැරිව පත්තරවලට කවි, කෙටිකතා ආදිය රචනා කරනු ලබනවා.

පවතින ධනපති ක්‍රමයටත්, එහි නියමුවන්ටත් එරෙහිව යුක්තියේ හා සත්‍යයේ මාවත තෝරාගත් ඔහු ජනතා විමුක්ති පෙරමුණ හා එක්ව පූර්ණාලීන විප්ලවවාදියෙක් ලෙස තම පන්තියේ මිනිසුන් වෙනුවෙන් සිය යුතුකම් ඉටු කිරීමට කැප වෙනවා. ඒ වෙනුවෙන් විටෙක තුවක්කුවද තවත් විටෙක පෑනද සුහුරු ලෙස මෙහෙය වූ ඔහු හැමවිටම සිය අරගලය වෙනුවෙන් කොන්දේසි විරහිතව පෙනී සිටිනවා. ඔවුන්ට එරෙහිව නැගුණු මර්දනය ඉදිරියේ යුක්තිය වෙනුවෙන් කරනු ලබන සිය අරගලය පාගා දමන්නට ඔහු කිසිසේත්ම ඉඩ දුන්නේ නැහැ. ජීවිතයේ අඳුරු අහුමුළු දිගේ ආලෝකය හඹා ගිය ඔහුගේ ජීවිතය අදටත් අපේ අරගලයට ධෛර්යය රැගෙන එනු ලබන්නේ ඒ නිසාවෙනුයි....

***"නොපනත් ලොවට මා නොපෙනේ***
***එහෙත් මුළු ලෝකයම මට පෙනේ....***
***මම දැන් සැඟවී සිටින්නෙමි***
***එහෙත් හැම අතම සැරිසරන්නෙමි***
***හිරුමඬල සේ***
***මගේ හදවත ඉතා උණුසුම්ය....***
***පොස්පරස් අංශුවක් වාගේම***
***මගේ හදවත දිලෙයි මා තුළම...."***

# දැනුම කියන්නේ සමාජීය ඵලයක්



### සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක
### රංගන ලක්මාල් දේවප්‍රිය සහෝදරයා

### කොතලාවල පනතට එරෙහි අරගලය ඇතුළු අනෙකුත් සිසු අරගල මර්දනයත් සමඟ නැවතිලා ද?

මර්දනය හමුවේ අරගලය නැවතුනා කියලා හිතනවා නම් ඒක වැරදියි. ආණ්ඩුව උත්සාහ කළේ කොවිඩ් තත්ත්වය හමුවේ විශ්ව විද්‍යාල වසා තිබෙන වටපිටාවක පසුගිය ජූලි 08 දා මෙම පනත ගේන්නයි. මොකද එවිට විශ්ව විද්‍යාල සිසුන් හරහා ගොඩනැගෙන විරෝධය මගහැරිය හැකි නිසායි. නමුත් කොවිඩ් වසංගත තත්ත්වය තුළ වුවත් ශිෂ්‍යයින්, ගුරුවරුන්, විශ්ව විද්‍යාල ආචාර්යවරුන් සහ අනෙකුත් ප්‍රගතිශීලී පිරිස් එකතු වෙලා ගොඩනගපු දැවැන්ත විරෝධතාවය හමුවේ ආණ්ඩුව ප්‍රකාශ කළේ දැනට පවතින විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පනත අනුව මෙම කොතලාවල පනතත් සංශෝධනය කරලා නැවත ඉදිරිපත් කරන බවයි. ඒ අනුව ආණ්ඩුවට මෙම පනත තාවකාලිකව හකුළා ගන්න සිද්ධ වුණා. ඒ වගේම ආණ්ඩුව මෙම අරගලය මර්දනය කරන්න උත්සාහ කළත් එය සාර්ථක වුණේ නැහැ.

### ඇයි අපි නිදහස් අධ්‍යාපනය රැක ගැනීම වෙනුවෙන් මෙතරම් සටන් කළ යුත්තේ?

ඇත්තටම අපේ රටේ තියෙන්නේ නිදහස් අධ්‍යාපනයට වඩා නොමිලේ අධ්‍යාපනය යැයි කිව්වොත් නිවැරදියි. එසේ නොමිලේ අධ්‍යාපනය හඳුන්වා දීම තුළින් අපේ රටේ සාක්ෂරතාවය ඉතා ඉහළ අගයක් ගැනීම සහ සාමාන්‍ය ජනතාවගේ දරුවන්ට අධ්‍යාපන අයිතිය හිමි වීම වැනි කාරණා ගණනාවක්ම ඉටු වුණා. කොහොම නමුත් රටේ ජනතාවගෙන් 40%ක් පමණ දිනකට ඩොලර් දෙකකටත් වඩා අඩු ආදායම් ලබන අයයි. ඒ නිසා අධ්‍යාපනය ලැබීමේ අයිතිය මුදල් මත තීරණය වුවහොත් බොහෝ දෙනෙකුට අධ්‍යාපනය ලැබීමේ අයිතිය අහිමිව යනවා. ඒ නිසා නොමිලේ අධ්‍යාපනය ලබා දීම අප රැකගත යුතුමයි. නමුත් ශිෂ්‍ය ව්‍යාපාරයක් ලෙස අපේ අරමුණ වන්නේ ඊටත් ඉදිරියට ගොස් ඇති නැති, කුල මල, ජාති ආගම්, ලිංග භේදයකින් තොරව සියලු දෙනාටම නිදහස් අධ්‍යාපනය ලබා දීමට මැදිහත් වීමයි.

අනෙක් අතට දැනුම කියන්නේ සමාජයක් විසින් කැප කිරීම් කරලා එකතු කර ගත්තු දෙයක්. ඒ නිසා දැනුම කාටවත් විකුණන්න හෝ තනිව මිලදී ගන්න අයිතියක් නෑ. දැනුම අප හැමෝටම අයිතියි. ඒ අයිතිය අප හැම සතුයි.

### සමහරු කියන්නේ ශිෂ්‍යයින්ට දේශපාලනය අදාළ නැති බවයි. ඒ කාරණයට ඔබ එකඟ ද?

අපි නම් හිතන්නෙ මේ රටේ හැමෝම දේශපාලනය කළ යුතුයි. අනෙක අපි එහෙම හිතුවත් නැතත් සවිඥානිකව හෝ අවිඥානිකව හැමෝම දේශපාලනය කරනවා. සවිඥානිකව දේශපාලනය කරන අය දන්නවා තමන් කරන දේශපාලනය මොකද්ද, තමන්ගේ මතය මොකද්ද කියන එක ගැන. නමුත් අවිඥානිකව දේශපාලනය කරන අයට වෙන්නේ තවත් කෙනෙකුගේ දේශපාලන වුවමනාවන් වෙනුවෙන් පාවිච්චි වෙන්නයි. ශිෂ්‍යයෝ දේශපාලනය කරන්න ඕනේ නෑ කියන අය කරන්නෙත් තමන්ගේ දේශපාලන පැවැත්ම වෙනුවෙන් අන් අයගේ දේශපාලන ක්‍රියාකාරීත්වය සීමා කිරීමක්ම තමයි.

ඒ නිසා ශිෂ්‍යයෝ දේශපාලනය කරන්න ඕනේ කරුණු දෙකක් නිසා. එකක් තමයි තමන් ජීවත් වෙන සමාජය තේරුම් ගනිමින් එය අධ්‍යයනය කිරීමටයි. අනෙක තමන්ට තියෙන ප්‍රශ්නවලට මැදිහත් වීමට සහ ඒවා වෙනස් කිරීමටයි. ඒ නිසා මේ කරුණු සම්බන්ධයෙන් අවබෝධයෙන් ක්‍රියාත්මක වීම තමයි දේශපාලනය කියලා කියන්නේ. අනෙක ශිෂ්‍යයෝ තමයි මේ රටේ අනාගතය. ඔවුන්ගේ අනාගතය වෙනුවෙන් ගන්න තීන්දු තීරණවලට ඔවුන්ගේ මතය ද අත්‍යාවශ්‍යයි. ඒ නිසා ශිෂ්‍යයින්ට දේශපාලනය අදාළයි. ඔවුන් දේශපාලනය කළ යුතුමයි.

### එහෙම නම් ශිෂ්‍යයෙකුට පැවරෙන සමාජ කාර්යභාරය කුමක් ද?

1970 දශකයට කලින් තිබුණු ශිෂ්‍ය ව්‍යාපාරය මූලික වශයෙන්ම මැදිහත් වුණේ තමන්ට තියෙන අධ්‍යාපන ගැටලු සම්බන්ධයෙනුයි. නමුත් සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ව්‍යාප්තියත් සමඟ අධ්‍යාපනය සම්බන්ධ ගැටලුවලින් ඔබ්බට ගොස් පොදු සමාජ ගැටලු වෙනුවෙන් සහ ජනතාවගේ අයිතීන් දිනා ගැනීම වෙනුවෙන් පවා සටන් කරන්නත් ඔවුන් පෙළඹුනා.

අපේ රටේ ශිෂ්‍ය ව්‍යාපාරය කාලයක් තිස්සේ නිදහස් අධ්‍යාපනය රැක ගැනීම වෙනුවෙන් සටන් කරනවා. අධ්‍යාපන ධවල පත්‍රිකාව, කිංස්ලි සිල්වා කමිටු වාර්තා, ජයතිලක කමිටු වාර්තා යනාදී විවිධ නම්වලින් එකම අධ්‍යාපන පෞද්ගලීකරණ ප්‍රතිපත්තිය දිගින් දිගටම ගෙන එනවා. මේ නව ලිබරල් ධනවාදයේ ප්‍රතිපත්තිය අධ්‍යාපනය විකිණීම නම් ඔවුන් එය තිබෙනා තුරු එයම ප්‍රතිපත්තියක් ලෙස ගෙන ඒමට උත්සාහ කරනවා. ඒ අනුව ගත්තහම අපේ රටේ ශිෂ්‍යයාගේ කාර්යභාරය වන්නේ නිදහස් අධ්‍යාපනය රැකීම වෙනුවෙන් සටන් කිරීම හෝ පොදු ජනතාවගේ ගැටලු වෙනුවෙන් සටන් කිරීම පමණක්ම නෙවෙයි. මේ ප්‍රශ්නවලට හේතු වන ධනවාදී ක්‍රමය වෙනස් කිරීමට සක්‍රියව දායක වීමේ සමාජමය කාර්යභාරයත් ශිෂ්‍යයාට පැවරී තිබෙනවා.

### එසේ නම් මේ කටයුත්තේ දී ලාංකේය ශිෂ්‍ය ප්‍රජාව විසින් සමාජවාදී ශිෂ්‍ය සංගමය තෝරාගත යුත්තේ ඇයි?

අපේ රටේ ශිෂ්‍ය සංගම් බොහෝමයක් තියෙනවා. ඒ හැම එකක්ම දේශපාලනය කරනවා. සමහර ඒවා සෘජුවම දේශපාලන පක්ෂවලට සම්බන්ධයි. ඔබ මුලින් ඇහුවා ශිෂ්‍යයාගේ කාර්යභාරය පිළිබඳව. ඒ නිසා මම මුලින් කිව්ව සමාජ කාර්යභාරය ඉටු කරන්න නම් ශිෂ්‍යයා තමන් දරන මතයට සමපාත මතයක් දරන දේශපාලන පක්ෂයකට සෘජු සම්බන්ධතාවක් ඇති ශිෂ්‍ය සංගමයක් තෝරාගත යුතුයි. එහිදී පවතින සමාජ ක්‍රමයට උදව් කරන දේශපාලන පක්ෂයක් සමඟ මේ කටයුත්තට මැදිහත් විය නොහැකියි. ඒ නිසා විකල්ප ධාරාවේ දේශපාලන මතයක් සහිත පක්ෂයකට සම්බන්ධ ශිෂ්‍ය සංගමයක් තෝරාගත යුතුමයි. ඒ නිසා අපි මේ රටේ ශිෂ්‍ය ප්‍රජාවට ආරාධනා කරනවා ශිෂ්‍යයාගේ අධ්‍යාපන ගැටලු, මහජනතාවගේ ප්‍රශ්න සහ පොදුවේ සමාජ ගැටලුවලට මැදිහත් වන සමාජවාදී ශිෂ්‍ය සංගමය සමඟ එකතු වන ලෙසට.

FORWARD

සමාජවාදී තරුණ සංගමයේ මධ්‍යම පුවත්පත

464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
Tel: 0112076198
Email: syuforwardnews@gmail.com
syulanka@gmail.com
fb:syulanka
web:syusrilanka.com

# මිනිස් මනසට වසන්තයක් කරගත යුතු කෝවිඩ්

කෝවිඩ් සමස්ත රටේම මේ දක්වා රට පාලනය කළ මේ වනවිටත් පාලනය කරන බලය හිමි පන්තියේ නිරුවත හෙළි කර ඇත. සාමාන්‍ය තත්ත්වයක් තුළදී සුපුරුදු පරිදි ජනතාව තලා පෙළමින් තම පැළැන්තියේ අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් යුහුසුළුව කටයුතු කරන පාලක පන්තිය රට තුළ  ව්‍යසනයක් ඇති වූ විට එයට මුහුණ දීමට තරම් ශක්තියක් හෝ ධෛර්යයක් වැඩපිළිවෙළක් ඔවුන් සතුව නොමැති ය. එහි අසාර්ථකත්වය සමාජයේ දසදෙසින් විද්‍යමාන වෙමින් පවතී. සුපුරුදු ලෙස ජනතා දේපල කොල්ලකෑමේ ව්‍යාපෘතියක මේ මොහොතේත් පාලක පැලැන්තිය හා ඔවුන් වටා රොක් වී සිටින ව්‍යාපාරික කල්ලියක් විසින් සිදුකරමින් සිටියි.

නමුත් වෙනදාට වඩා වේගයෙන් ජනතාව එය තේරුම් ගනිමින් සිටී. කෝවිඩ් වසංගතයක් වුවද එයින් ලැබුණු විවේකයත් නිදහසත් යොදා ගත් මිනිසුන් මෙපමණ කලක් හිතන්නට මතන්නට කාලයක් නොමැති වීමෙන් අත්හැරුණු ඒ සමාජ යථාර්ථය තේරුම් ගනිමින් එය වෙනස් කිරීමට මැදිහත් වෙමින් සිටී.

රටේ ජනතාව සිදුවෙන දේශපාලන සිදුවීම් ගැන සිද්ධීන් ලෙස විග්‍රහ කරමින් එහි අඩුපාඩු ප්‍රකාශයට පත් කරමින් පසුගිය කාලය පුරාවටම සංවාදයක යෙදී සිටියහ. නමුත් එයින් මෙහි යථාර්ථය මිනිසුන් හට නොතේරුණා විය හැකිය. පාලනය හොබවන පාලකයන්ගේ වැරැදි දැකීමෙන් හැමදාම සිදුවූයේ ඔවුන් හා සමගාමීව කටයුතු කරන අනෙක් පාලක කණ්ඩායම බලයට ගෙන ඒමයි. එයින් ජනතාවට සෙතක් නොවීය. දැන් දැන් තරුණයින් වැඩිහිටියන් අවුරුදු හැත්තෑ තුනක් පැවති ගැටළුවේ මූලය හොයමින් සිටී. මේ රට මේ දක්වා තට්ටුමාරු ක්‍රමයට පාලන බලය වෙනස් කරමින් පැමිණියේ එකම කණ්ඩායමක් බවත් ඔවුන්ව පාලනය කරනු ලැබුවේ කොල්ලකාරී වංචනික ව්‍යාපාරික කල්ලියක් විසින් බවත් ඔවුන් හැමදාම මෙම ආර්ථිකය හැසිරවීමේ බලය ඔවුන් සතු කරගෙන සිටි බවත් දැන් දැන් ජනතාවට තේරුම් යමින් සිටී.

system change වන්නට නම් මනෝ මූලික තත්ත්වය නිර්මාණය විය යුතුය. ජනතාව විසින් මේ විෂම සමාජය බෙදා ඇති මූලික ස්වරූපය හඳුනාගත යුතුය. එහි ගොදුරක් වී ඇති ආකාරය තේරුම් ගත යුතුය. එය වැටහුනු කළ බහුතරයක් වූ ජනතාව විසින් සුළුතරයක් වූ මේ ආර්ථිකය හොබවන රටේ ජාතික ආදායමෙන් 90% භුක්ති විඳින 10% වඩා අඩු ව්‍යාපාරික කල්ලියත් ඔවුන්ව ආරක්ෂා කරන දේශපාලන කණ්ඩායමත් පරාජය කරනු ඇත. එහි පෙරමුණු කාර්යභාරය මේ රටේ 80 දශකයෙන් පසු පරම්පරාව සතු වගකීමක්ව පවතින්නේය. කෝවිඩ් මනසට වසංගතයක් කරගත යුත්තේ මේ තරුණ පරපුරයි.

**සැප්තැම්බර් 13**

## බුදුදහමට මුවාවී ජාතිවාදයට ආවැඩීම

වත්මන් ආණ්ඩුව බලයට පැමිණීමට ජාතිවාදය ආගම්වාදය පාවිච්චි කළ බව රහසක් නෙවෙයි. පාස්කු ප්‍රහාරයද බලයට පැමිණීම වෙනුවෙන් කළ නාට්‍යයක් බව මේ වන විට සමාජය තුළ මතයක් බවට පත්වෙලා. මේ ආණ්ඩුව බලයට ගෙනඒමට විවිධ ජාතිවාදී සංවිධාන, භික්ෂූන්වහන්සේලා එළිපිමට ජාතිවාදය වැපුරූ බව ඉතා පැහැදිලිය, ඒ දවස්වල වඳ කොත්තු, දොස්තර සාෆිගේ සිංහල කාන්තාවන් වඳ කිරීම, පාස්කු ප්‍රහාරය, පල්ලිවල කඩු, ආදි නොයෙක් දේ කරලියට පැමිණියා මතක ඇති. ආණ්ඩුවට වසර දෙකක් ගෙවී ගොස් අවසන්, නමුත් අද වන විට වඳ කොත්තුත් නෑ, වඳ සාෆිත් නෑ. ඒ නාට්‍ය රඟ පා අවසන්. දැන් අලුත් නාට්‍යක් නැවතත් කරලියට එමින් තිබෙනවා. එහි පිටපතේ කොටසක් ඥානසාර හාමුදුරුවෝ විසින් එළි දැක්වූවා. රටේ ප්‍රශ්න වැඩිවෙනකොට දැන් දැන් ආණ්ඩුවට එරෙහිව විශාල ජනමතයක් ගොඩනැගෙමින් තිබෙනවා. ඒ විරෝධය මැඩපැවැත්වීමට, ජනතාවගේ මතය වෙනත් පැත්තකට හරවන්න තමයි ඥානසාර හාමුදුරුවෝ හරහා මේ ජාතිවාදි නාට්‍යය පිටපත් එළිබහින්නේ කියන එක නම් ඉතා පැහැදිලියි. හැබැයි දැන්වත් බලය වෙනුවෙන ආගම භාවිතා කිරීමට එරෙහි වීමට කාලය ඇවිත් බව ජනතාව වටහගත යුතුයි.

**සැප්තැම්බර් 15**

## කෝවිඩ් ප්‍රතිකර්ම සඳහා ජවිපෙන් සෞඛ්‍ය උපකරණ රැසක්

කෝවිඩ් රෝගීන්ට හා සෞඛ්‍ය සේවකයින්ට අතවශ්‍ය උපකරණ රැසක් ජවිපෙ විසින් මේ වන විට රට පුරා ඇති රෝහල් රැසකට



ලබාදෙමින් සිටින පොස්ට් බුකිය පුරා ෂෙයාර් වෙමින් තිබෙනවා. මෙම උපකරණ ජවිපෙ මන්ත්‍රී වැටුප් අරමුදලෙන් ලබාදෙන බව තමයි ඔවුන් පවසන්නේ. තම ඇමති දීමනා, ඇමති පඩිය කෝවිඩ් අරමුදලට ලබාදෙන්න බැරිබව ප්‍රසිද්ධියේ කියන ඇමතිවරු ඉන්න රටක ජවිපෙ විසින් ලබාදී ඇත්තේ කාට කාටත් මහඟු ආදර්ශයක්.

**සැප්තැම්බර් 16**

## ඉඩම් කොල්ලයට එරෙහිව පරිසර මිතුරෝ එකට එක්වෙයි



රාජපක්ෂ ආණ්ඩුව රටේ විශාල ඉඩම් ප්‍රමාණයක් කුණුකොල්ලයට විකිණීම පසුගිය කාලය පුරාම ආරම්භ කරා. ජනාධිපති මැතිවරණය වෙලාවේ පරිසරය රැකීමට පුරසාරම් දොඩපු ගෝඨාබය මහතා අද වන විට රටේ වටිනා පරිසර පද්ධති තම ගජමිතුරන්ට ඇවැසි විදිහට විනාශ කිරීමට ඉඩහරිමින් සිටී. එහි තවත් ඉඩම් ජාවාරමක් තමයි අනුරාධපුර දිස්ත්‍රික්කයේ අක්කර 102000ක ඉඩම් ප්‍රමාණයක් අවුරා ලංකා කියන සමාගමට ලබාදීමට කැබිනට් අනුමැතිය ලබාදීම. කෝමාරිකා වගාවක් ආරම්භ කරන මුවාවෙන් මෙම අති විශාල ඉඩම් ප්‍රමාණය ලබාගෙන තිබෙනවා. එසේ කියමින් ගොවීන්ගේ ඉඩම්ද ක්‍රම ක්‍රමයෙන් මේ වන විට එම සමාගම විසින් අත්පත්කර ගෙන ඇති බව ආරංචිමාර්ග තියෙන්නේ. ඒ වගේම විල්පත්තු අභය භූමියේ ප්‍රේරක කලාපය ද මේ වන විට ඩෝසර් කිරීමට ද පටන් අරගෙන. කෝමාරිකා වගාව කියමින් මේ එමින් සිටින්නේ, ගොවියාගේ ඉඩම් සහ විල්පත්තු අභය භූමියේ ඉඩම් අත්පත් කරගැනීමට හා ගොවියා ගොවිතැනින් ඉවත් කිරීමට බවයි ප්‍රදේශවාසින් පවසන්නේ. කෝමාරිකා වගාව ආරම්භකර දැනට වසර තුනක් ගතවී තිබුණත් එකම පැලයක්වත් මේ වන විට වගාකර නැති බවයි ජනතාව පවසන්නේ. ගජමිතුරන්ට ඉඩම් මංකොල්ලා කෑමේ ආණ්ඩුවේ මෙම ව්‍යාපෘතියට එරෙහිව සංවිධාන රාශියක් එක්  කරගනිමින් සුරකිමු විල්පත්තු සංවිධානය ගොඩනැගීම සිදුවුණා. හෙට දවසේ සිදුවන පරිසර විනාශයටද ඉඩම් කොල්ලයට එරෙහිවද නැගීසිටීමට එම සංවිධානයට ශක්තිය ධෛර්ය ලැබේවී.

**සැප්තැම්බර් 24**

## කෙරවල පිටිය රෑ 12ට හොරෙන්ම ඇමරිකාවට

අපේ රටේ විශාලතම බලාගරය තමයි කෙරවල පිටිය බලාගාරය. එය මේ වන විට අපේ රටේ මිනිසුන්ට අහිමි වීමේ අවධානමට ලක්ව තියනවා. සැප්තැම්බර් 17 දින රාත්‍රී 12ට හොරෙන්ම ඇමරිකන් සමාගමකට ලබාදීමට ගිවිසුමක් ගසා ඇති බව ජවිපෙ නායක අනුර



දිසානායක පසුගියදා හෙළිදරව් කරා.  ඇමරිකානු නිව් පෝට්රේස් එනජී සමාගම විසින් අත්සන් කළ බවත් එම නියෝජිතයා රාත්‍රියේම නැවත ඇමරිකාව බලා පිටත් වී ඇති බවත් ඔහු පවසනවා. එම ගිවිසුම කැබිනට් මණ්ඩලයදටද නොදන්වා ඇති බවයි පැවසෙන්නේ. විකුණු දේවලුත් නැවත පවරා ගන්නවා කියලා පට්ට කෙබර කෙලමින් ආපු බොරු දේශප්‍රේමී ගෝඨාබයගේ ආණ්ඩුවේ ඇත්ත ස්වරූපය දැන් දැන් එළියට පැමිණ තිබේ. දැන්වත් ඔය පාට කණ්නාඩි ගලවලා හොඳ සිහියෙන් ආපසු හැරී බැලීමක් කොරොත් හොදයි කියලයි ජනතාවට කියන්න තියෙන්නේ.



# රැල්ලට නොයා රැල්ල පාගමු!

අපි මුහුදු වෙරළට වෙලා රළ ගහන මුහුද දිහා බලන් ඉන්න අතරෙ අපේ දෙපා යට වැල්ල රැල්ලට හේදිලා යන්නේ අපිටත් නොදැනිමයි. මටත් මේක ඇත්ත නේද කියලා හිතුනේ දවසක් දා සුනිල් සෙනෙවි සර්ගෙ දේශනයක් අතරතුරදි සර් මේ කාරණය ගැන කිව්වහමයි. ඒ කතාව තුන්කල්හිම වලංගුයි නේද කියලා අදටත් මට නිතරම හිතෙනවා.

ඇත්තටම මිනිස්සු තමන්ගේ ජීවිත කාලයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ගත කරන්නේ එක එක විදිහෙ රැලි පාගමින් සහ නරඹමිනුයි. වෙලාවකට මහා විසාල රැලි නැගෙනවා. තවත් වෙලාවකට ඒවා ඉතා කුඩායි. ඒත් ඒ නැගෙන හැම රැල්ලක් ගානෙම අපේ කකුල්වලට යටින් තියෙන වැල්ල මුහුදට හේදිලා යනවා.

සිහියෙන් නොහිටියොත් එක මොහොතක් එනවා අපේ සමබරතාවය බිඳිලා යන. ඒ නිසා රැලි දිහා බැලුවට කමක් නැහැ, හැබැයි පරෙස්සමෙන්! මොකද නිකමට හරි සමබරතාවය ගිලිහිලා ගියොත් නහයෙත් වැලි ගෑවෙනවා.

ඉතින් අපේ ජීවිතත් හරියට මේ රැළි නැගෙන මුහුද වගේ. කාලෙන් කාලෙට එක එක රැළි එනවා, යනවා. ෆේස්බුක් චැලෙන්ජ් එකේ ඉඳන් ටීවී එකේ යන ගොඩක් ප්‍රවෘත්තිවල තියෙන්නෙත් එක එක ජාතියේ රැළි තමයි. ඒත් මේකෙදි පරෙස්සමට ලිහා ගන්න ඕනා කාරණා කීපයකුත් තියෙනවා. ඇත්තම කිව්වොත් මේ විදියට මතු වෙන සමහර රැළි ගත්තහම ඒවා ඉතාම ප්‍රගතිශීලීයි. උදාහරණයකට ගත්තොත් සිංහරාජය, විල්පත්තුව රැකගන්න සටන වගේම පරිසරය සුරැකීම වෙනුවෙන් ගෙනියපු සටන් රැල්ල ඉතාමත්ම වටිනවා. හැබැයි ඒ සටන ඉදිරියට ගෙනියන්න ඕනා බදියුර්දීන් වගේ මුස්ලිම් කැළෑ පාළුවන්ට විරුද්ධව විතරක් නෙවෙයි. සිංහල, දෙමළ, මුස්ලිම් මේ කොයි ජාතිකත්වයට අයිති වුනත් කැළෑ පාළුවා කැළෑ පාළුවම තමයි කියලා හිතලයි අරගල කරන්න ඕනා. එහෙම නොවුනොත් වෙන්නේ ප්‍රගතිශීලීත්වයයි පරිසර ප්‍රේමයයි රැල්ලට ගහගෙන ගිහිල්ලා ඒ වෙනුවට ජාතිවාදය සහ පාලකයින්ගේ කපටි දේශපාලන ගේම් වැල්ලට ගොඩගහලා ඇත්ත සටන අල වෙන එක විතරයි.

අනික් වැදගත්ම කාරණය තමයි මේ කොයි අරගලයේත්, මේ කොයි රැල්ලෙත් හැඩය අපි ස්ථිර ලෙසම හරියටම තේරුම් ගන්න ඕනා. නැත්නම් වෙන්නේ අර මං කලිනුත් කිව්වා වගේ එන එන රැල්ල පාග පාගා ඉඳලා අපිත් නොදැනිම අපේ කකුල් වාරු නැතිව යන එකයි. අනික විනාසකාරී සුනාමි රළක් එනකොට අපි කිසිසේත්ම රැල්ල පාගන්න බලන් ඉන්නෙ නැහැනෙ. අපි එතැනින් වහාම ඉවත් වෙනවා. ඒ වගේ තමයි, මේ සමාජය තුළ පැන නගින සමහර රැළිත්. අපි ඉවත් නොවුනොත් මුහුද ගොඩ ගලනවා වගේ මුළු සමාජයක්ම යට කරගෙන වේගයෙන් ඇදිලා යනවා.

අපි කවුරුත් පරෙස්සම් වෙන්න ඕනා අන්න ඒ නිසායි. අනික එක පිට එක රැලි නැගෙනවා, බිඳෙනවා වගේ එකක් පිටුපස එකක් සිදුවන සමහර සමාජ, දේශපාලන හා ආර්ථික සිදුවීම් අපි නිවැරදිව කියවා ගත යුතුයි. නැත්නම් වෙන්නේ රූප රාජිනියන්ගෙ ඔටුනු හුටපටය නිසා ඇෆ්ලටොක්සින් සහ පොල්තෙල් ප්‍රශ්නය යට ගියා වගේ එක රැල්ලක් මතු වෙනකොට අනික යට යන එකයි. ඉතින් එහෙම නොවී මේ සාතිශය බහුතරයක් විවිධ සිදුවීම් විසින් නිර්මාණය කරනු ලබන තත්වයන් සියල්ල අප එකම දිශානතියක් ඔස්සේ පෙළගස්වා ගත යුතුයි. කෙටියෙන්ම කියනවනම් ඒ ඒ සිද්ධියට අදාළ දේශපාලන හරය තේරුම් අරගෙන කටයුතු කළ යුතුයි. අන්න එවිට අපට හැකි වේවි පර්ල් නැවත්, දුමින්ද සිල්වා නිදහස් කිරීමත්, කොතලාවල පනතත් වගේ රැල්ලක් ලෙස සමාජය කළඹවපු බොහෝ මාතෘකා සියල්ලම පාහේ පවතින සිස්ටම් එකේ අවුල නිසා සිදුවුණු දේ බව තේරුම් ගන්න. එහෙම නොවුනොත් වෙන්නේ කාලෙන් කාලෙට පැන නගින රැලි වගේ කොයි රැල්ලත් මොහොතින් බිඳිලා විසිරිලා යන එක විතරයි.

ඒ නිසා ප්‍රවේසමෙන්.... රැල්ලට නොයා රැල්ල පෑගුවොත් වැල්ලෙ ඉඳන්ම ගේමක් ගහන්න බැරි නැහැ.



# හොරුන්ට (තමන්ටම) ඉනිමන් බැඳගන්නා නව මූල්‍ය පනතක්!

වර්තමාන ආණ්ඩුව බලයට ඒම සඳහා යොදාගත් ප්‍රධාන සටන් පාඨයක් වූයේ යහපාලන ආණ්ඩු සමයේ සිදුවූ, එතෙක් හෙළිදරව් වූ දැවැන්තම මූල්‍ය වංචාව වන මහබැංකු වංචාවයි. එයට හවුල් වූ රනිල් වික්‍රමසිංහ, රවී කරුණානායක, අර්ජුන් මහේන්ද්‍රන් වැන්නවුන්ට සති දෙකෙන් දඬුවම් පමුණුවා වංචා කළ මුදල් නැවත ලබාගන්නා බවට දිවුරා පොරොන්දු විය. නමුත් දැන් පෙරළී ඇත්තේ එහි කණපිටය. පොරොන්දු සියල්ල කණපිට හරවා මහබැංකු වංචාවෙන් දැවන්ත ධනස්කන්ධයක් සොයාගත් අර්ජුන් මහේන්ද්‍රන්ලාට එම මුදල් නීත්‍යානුකූල කරගැනීමට අවැසි පනත් පාර්ලිමේන්තුවේ සම්මත වීමය.

2021 අංක 18 දරණ මුදල් පනත් කෙටුම්පත සඳහා පසුගිය 15 වනදා කතානායක අත්සන් තැබීමත් සමඟ එය රටේ නීතියක් බවට පත්විය. ඒ අනුව,

01. මෙතෙක් බදු නොගෙවා හෙළිදරව් නොකළ ධනය 1%ක බද්දකට යටත් කොට හෙළිදරව් කිරීමට නීත්‍යානුකූල අවසරය හිමි වේ.

02. මෙතෙක් ආණ්ඩුවට ගෙවිය යුතු බදු මුදල් නොගෙවා සිටි අයට 2020 මාර්තු මස දක්වා හිඟ බදු මුදල් කපා හැරීම සිදු වේ.

03. මෙම පනත මගින් හෙළිදරව් කරන ධනය මුදල් විශුද්ධිකරණ පනතේ නීතීවලට යටත් නොවීම මෙන්ම එම පුද්ගලයින්ගේ තොරතුරු මොනම තත්වයක් යටතේවත් හෙළිදරව් කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බවට පත් කිරීම සිදු වේ.

මෙසේ හෙළිදරව් නොකළ ධනය තිබෙන්නේ කා ළඟද? අර්ජුන් මහේන්ද්‍රන් ළඟය. ඇලෝසියස්ලා ළඟය. මල්වානේ ගේ සහ ඉඩමේ අයිතිකරුවන් ළඟය. ඩෙසී ආච්චිගේ මැණික් මල්ලෙන් ඉඩම් ගත් අය ළඟය. චීන ව්‍යාපෘතිවලින් 10%ක කොමිස් මුදලක් ලබාගත් අය ළඟය. සුනාමි ආධාර හොරකම් කළ අය ළඟය. මාකඳුරේ මධුෂ්ලා, වෙලේසුදාලා වැනි මහා පරිමාණ කුඩු ව්‍යාපාරිකයින් ළඟය. මහා පරිමාණ මිනිස් ඝාතනවලට සම්බන්ධ වූ අය ළඟය. පාස්කු ප්‍රහාරය සැලසුම් කළ හා ඒවාට ඔත්තු සැපයූ අය ළඟය. ඒ අනුව ඕනෑම කූට හා අනීතික ක්‍රම මගින් මුදල් ඉපයූ ඕනැම අයෙකුට තම ධනය නීත්‍යානුකූල කරගැනීමට මෙම පනත මගින් අවසර හිමි වන්නේය.

එමෙන්ම සෑම ව්‍යාපාරිකයෙක්ම තමා උපයන ධනයෙන් කොටසක් බදු ලෙස ආණ්ඩුවට ගෙවිය යුතුය. නමුත් මෙම පනතින් යෝජනා කරන්නේ එසේ බදු නොගෙවූ අය 2020 මාර්තු මස දක්වා බදුවලින් නිදහස් කිරීමය. එසේ බදු නොගෙවූ අය කවුද? බදු නොගෙවීම යනු දඬුවම් ලැබිය හැකි වරදකි. මහ භාණ්ඩාගාරයට ලැබිය යුතු ධනය සොරකම් කිරීමකි. බදු වංචා කිරීමකි. එසේනම් කළ යුතු වන්නේ එවැනි බදු වංචාකරුවන්ට දඬුවම් පමුණුවා නොගෙවූ බදු මුදල්ද, ඊට අදාල දඩ මුදල්ද අය කරගැනීමය. නමුත් මෙම පනතින් යෝජනා කරන්නේ එම බද්ද මෙන්ම දඩ මුදලද කපා හැරීමටය.

උදාහරණයක් ලෙස සාමාන්‍ය ජනතාව පරිහරණය කරන යතුරුපැදියට ආණ්ඩුව වාර්ෂික බද්දක් අයකර ගනී. ආදායම් බලපත්‍රය ලෙස අප වාර්ෂිකව එය ගෙවනු ලබයි. එසේ අප ලබාගන්නා වාර්ෂික බලපත්‍රය මසක් හෝ ප්‍රමාද වුවහොත් එයට දඩ මුදලක්ද අය කරගනී. එසේ සාමාන්‍ය ජනතාව මත අකුරටම ක්‍රියාත්මක වන බදු නීති මෙම පනත මගින් මහා පරිමාණ ධනයක් උපයන ව්‍යාපාරිකයින් ඉදිරියේ දණගස්සවා ඇත. නමුත් එම ව්‍යාපාරිකයින් ජාතික ගොඩනැගීමේ බදු, ආර්ථික සේවා ගාස්තු ලෙස එම බදු මුදල් මහජනතාවගෙන් අයකරගෙන ඇත. ජනතාවගෙන් ලබාගත් බදු මහ භාණ්ඩාගාරයට ලැබිය යුතුමය. නමුත් මේ නිදහස් කරන්නට යෝජනා කරන්නේ එම බදු මුදල්ය. මේ නිසා මහ භාණ්ඩාගාරයට ලැබිය යුතු වැට් බදු ලෙස 8%ක්ද දඩ මුදල් ලෙස අවම වශයෙන් 2%ක්ද වශයෙන්  10%ක බදු ප්‍රමාණයක් අහිමි වී යයි. මේ සිදුකරන්නේ ආණ්ඩුවට 1%ක කප්පමක් ලබාගෙන බදු වංචාකරුවන් නිදොස් කොට නිදහස් කිරීමය.

එමෙන්ම මෙම පනතට අනුව මෙම හෙළිදරව් කරන ධනය කාගේද, කුමන ආදායම් මාර්ගවලින් ඉපයූවේද යන්න හෙළිදරව් කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් ලෙස දක්වා ඇත. බදු ගෙවන්නන්ගේ රහස්‍යභාවය ආරක්ෂා කිරීම එම ආයතනවල වගකීමකි. නමුත් කිසියම් වංචාවක් හෝ අපරාධයක් සම්බන්ධයෙන් සිදුවන අධිකරණ කටයුත්තකදී ඒවා පරීක්ෂා කිරීමේ අයිතිය නීතිපතිවරයාට, අධිකරණයට, ආනයන අපනයන පාලකවරයාට, විගණකාධිපතිවරයාට, විනිමය කොමිෂන් සභාවට හිමි වන්නේය. නමුත් මෙම පනත හරහා මෙම ආයතනවලට තිබූ පරීක්ෂා කිරීමේ බලයද අහිමි කොට ඇත.

මෙසේ සම්මත කරගත් පනත හරහා රටක් ලෙස මුහුණදීමට සිදුවන ගැටළු බොහෝමයකි.

01. ඕනෑම දූෂිත ක්‍රමයකට (මත්කුඩු ජාවාරමෙන් පවා) මුදල් උපයන්නන්ට, අපරාධකරුවන්ට පවා අපේ රටට මුදල් ගෙන ඒමට මෙන්ම හෙළිදරව් කිරීමට හැකි වීම නිසා තව තවත් අපරාධ හා දූෂිත ක්‍රමවලින් මුදල් ඉපයීම වේගවත් වනු ඇත.

02. මහා පරිමාණ ව්‍යාපාරිකයින් බදුවලින් නිදහස් කිරීම නිසා මහ භාණ්ඩාගාරයට ලැබිය යුතු මහා ධනස්කන්ධයක් අහිමි වී යාම මෙන්ම බදු ගෙවන්නන් පවා අධෛර්යමත් වීමද භාණ්ඩාගාරයට ලැබෙන මුදල් අඩු වීමට බලපානු ඇත.

03. මෙම පනතට අනුව මුදල් හෙළිදරව් කරන්නන්ගේ තොරතුරු හෙළිකර ගැනීමට නොහැකි පරිදි නීති සම්පාදනය වන නිසා මෙතෙක් බලාත්මකව පැවති විනිමය නීති, ආදායම් නීති හා බදු නීති මෙන්ම අධිකරණ බලය හා ආනයන අපනයන නීතිද අභියෝයට ලක් වන්නේය.

04. මෙමගින් රටක් ලෙස ජාත්‍යන්තරය ඉදිරියේදී අපකීර්තියට මෙන්ම අභියෝගයටද ලක්විය හැක.

නමුත් තවදුරටත් මෙම කූට පාලකයින් සිදුකරමින් පවතින්නේ මෙම පනත ක්‍රියාත්මක කරගැනීමට පහසු වන පරිදි රාජ්‍ය පද්ධතිය පවා අනීතික ලෙස වෙනස් කිරීමය. ඒ අනුව මහබැංකු ක්‍රියාවලියද තමන්ට රිසි පරිදි වෙනස් කරගනිමින් ඇත. අජිත් නිවාඩ් කබ්රාල් මහබැංකු අධිපති වීමත්, මූල්‍ය මණ්ඩලයේ සිටින අවංක නිලධාරීන් එම නිලයන්වලින් පහකිරීමත් සිදුවන්නේ ඒ අනුවය. මහබැංකු මංකොල්ලය ඇල්ලීම වෙනුවෙන් බලයට පත් පාලකයින් මේ සිදුකරන්නේ හොරකමට ඉනිමන් බැඳගැනීමකි. තමන් මෙන්ම තමන්ගේ හිතවතුන් හොරකම් කළ, ජනතාවට අයිති මහා ධනස්කන්ධයක් නීත්‍යානුකූල කරගැනීමය. තව තවත් හොරකම් කිරීමට ඉඩහසර විවර කරගැනීමය; විවර කරදීමය.




අඩ වැටුපක සේවය හමාර කොට නිවසට ආ ඇය, උයන-පිහන-අමදින මුළුතැන්ගෙය ඇයව නැවත සේවයට කැඳවද්දීත් 'ඊයේ බාගෙට කියවා අවසන් කළ පොත' අතට ගන්නීය. සෝදන-අමදින ඒ කඩිසර ඇඟිලිතුඩු පන්හිඳක මෙහෙයවමින් ඇය හඬගා කියන්නීය. ලියන්නීය........

"අකමැතිය මා, ගැහැණියකගේ මොළය හැඳිමිටෙන් මනිනවාට!!"

ඈ සුහර්ෂිණී ධර්මරත්නයි. සම්මානනීය ලේඛිකාවක වන ඇයගේ "එහෙම වරදක් කරල නෑ මම"- කාව්‍ය සංග්‍රහය දකින්නට අපි මේ සාහිත්‍ය මාසයේදී ඉඩහසර වෙන්කරගමු...!

මෙලොව බිහිව ඇති කවර ගණයේ උසස් කලා නිර්මාණයක් වී නම්, ඒවා බිහිවී තිබුණේ මේ සමාජය සුවපත් කිරීමේ අභිලාෂයෙනි. සුහර්ෂිණී නම් කිවිඳිය අපට හමුවන්නේද එතැනදීය.

*"තණබිම පිස හමන සුළඟද*
*අලුත් අස්වැන්නක පිදුරු සුවඳද*
*ගිනි මද්දහනේ ගෙවිලයක*
*දෙස් තියන*
*කඨෝර හඬද*
*දරුවන්ගේ බඩගිනි කෙඳිරියද මට ඇසෙන්නේය..*
*ගැහැණියක අපවිත්‍ර වන්නේ*
*ලොව පවිත්‍ර කිරීම සඳහාය.*
*එය මට හඬගා කීමට අවැසි ය..*
*බෝතල් මූඩි ගැලවෙන*
*වියත් සංවාදවල*
*ඔබේ කවි අතර*
*මගේ කවි නොසොයන්න!"*

වැඩබිම, මුළුතැන්ගෙයින් එහා ලෝකයට කතාකිරීමට ඇයට අවැසිය. මිනිසෙකු ලෙස සියලු අයිතීන් කාන්තාවන්ටත් හිමිවන වඩා සාධාරණ සමාජයක් ඇයට අවැසිය.

*"බසයෙන් දුම්රියෙන්*
*පය පැකිළ වැටෙන විට*
*දිගුවේය අත්...*
*මහතුනි,*
*ඔබේ බිරිඳත්*
*අවදානම් ගමනක ය..*
*තනි මඟක ය..*
*ඇසෙනවද? අසනවද ඔබ?*
*මුළුතැන්ගෙයින් එන*
*හැඳිවළං ගැටෙන හඬ*
*මදින අමදින හඬ*
*කුඩමසු පිළීගඳ..*

*ඉතින් ඔබ යන්න මුළුතැන්ගෙට*
*විමසන්න*
*මහන්සිද ඇයට?*
*ඉඳහිට!...."*

දියණියක, යෙහෙළියක, පෙම්වතියක, ගුරුවරියක වූ ඇයට දැන් අවශ්‍ය වන්නේ මවක ලෙස තම දරුවන් වෙනුවෙන් මේ අපවිත්‍ර සමාජය පිළිසකර කිරීමට ය..

"කඳු මුදුන්වල මීදුමෙන් මට තාම දුම්රොටු පේනවා

කන්ද පාමුල බාලචන්ද්‍රන් කිරි හිනාවක් පානවා

නුඹට ගෙන ආ දෝසි අහුරක් පුංචි දෑතේ තියෙනවා

ජූලි කළුවර සුදු කරන්නට හීනයක් මට තියෙනවා"

පැහැදිලි ය.. ඈව අපට හමුවන්නේ එවන් උසස් අරමුණක් අභියස ය..

*"සාමිනාදන් විමල්,*
*රන් හිරු රැසින් දිදුලන*
*සුධවල මහා පොත්ගුල*
*දුම්රොටු පහව ගිය*
*නිල් වලා කැටි අතරින්..*
*සුරත දිගුකර පෙන්වන්න...*

*ආදරය සෙනෙහස පසුතැවුම*
*මහ පොතක සේ*
*එකට බැඳ*
*එවන මේ පණිවිඩය*
*කියවන්න....*

*පඬිපුර*
*සෙනෙහසින් අවුළන්න..*
*මගේ වම් පියවුර අසල*
*ගැහෙනා හදවත*
*කඩා*
*පොළොවේ ගසන බව*
*දන්වන්න!.."*

එකම පොළොවක හුස්ම වළඳන, එහෙත් එකම පොළොවකට මරාගන්නා එකම වර්ගයේ මිනිසුන්ගේ හදවත්වලට ඈ කතා කරන්නේ එලෙසය. රිදුණු බිඳුණු හදවත් සුවපත් කරන්නේ එලෙසය.



"පාසලේ පෙළ පොතෙන් මට පෙන්වූ ලෝකය

*දිග හතරැස් තනි පිටුවකි*
*උතුර දකුණ*
*බටහිර හා නැගෙනහිරත්*
*හතර කෙළවරට විසිකළ...*
*දැල් දැල් කොටුවල සිරකළ....*

*බලමි අහසට නැග*
*මා පතන ලෝකය..*
*මුහුදු ගොඩබිම් මිස*
*බෙදුම් රේඛා නැති..*

*උස් කඳු මුඳුන් ය*
*නිල් පැහැති වන රේඛා ය*
*ඒ මැදින් මහ ගංගා ය*
*යුහුව නෑගම් යන..*

*මේ මගේ ලෝකයයි*
*මගේ දරුවන්ට මා පෙන්වන...."*

ඇයට උරුම නොවූ යහපත් ලෝකය ඇගේ දරුවන්ට, අනාගත පරපුරට හෝ ලබාදීමට ඇයට අවශ්‍ය ය. ඒ වෙනුවෙන් ඈ සටන් කරන්නීය. ඇගේ සටන්බිම පන්හිඳ ය. ආයුධ සරල, අලංකෘත වහර ය, ජීවිත අත්දැකීම් ය. ඇගේ දැක්ම ය.

සුහර්ෂිණී නම් කිවිඳියගේ මෙම කාව්‍ය සංග්‍රහයේ ගිළෙන්නට අපට හැකිය...ඒ දියබුං ගා, හිස් අතින් ගොඩට පිහිනීමට නොවේ!, ජීවිතයට යමක්ද රැගෙන ය. සාහිත්‍යය නම් වූ කලී එයමය. ජීවිත සිහිල් කිරීමය. වඩා වැඩියෙන් අර්ථගැන්වීමය.

# සරදියෙල්ගේ කොලම

*ඉතා රුවැති ලියෝ ඉන්න රටක ඉන්න අපේ හාදයෝ ටිකක් අගමැට්ටට හූ තියලා. ඒ ජරමර අස්සේම මෙහේ ආයතන වල ලොක්කෝ ඉල්ලා අස්වීමේ තරගයක් පටන් ගෙන.*

*ඒ දවස්වල කට්ටිය නම් කිව්වේ අපේ ස' එක්ක සෙල්ලම් බෑ. වැඩ කළේ නැත්නම් අස් කරනවා කියලා. දැන් මෙන්න මුන් ස' එක්ක වැඩ කරන්න බෑ කියලා ඉල්ලා අස්වෙනවා. ගිලෙන් නැවෙන් මීයෝ එළියට පනින වගක් තමයි සරදියෙල්ට නම් පේන්නේ.*

*ඉබ්බා දියේ දැම්මම ඇන්නෑවේ කිව්වා වගේ ලොකු බැංකුවේ ලොක්කා කලකිරිලා ඉල්ලා අස් උනාම කබරයා ඇතුලට රිංගුවා සුටුස් ගාලා. කබරයා නිසා හිස් වෙච්ච දියවන්නාවේ සීට් එකේ දුවන් ඇවිත් වාඩි උනා කැටයා. සංගීත පුටු තරගේ වගේ...*

*නමට කලුවර නීතිය දික් කොරනවා. හැම තැනම මිනිස්සු පෝලිම් වල පොරකනවා. බාර් එක ගාව පෝලිමේ උන්ට පොලෝසියේ මහත්තුරුන්න්ගේ නොමද අනුග්‍රහය. ඉක්මනට බෝතලේ අරන් යන්නලු. පොඩි එකාට කිරි පිටි නැතිව කිරි පිටි හොය හොය ගිහින් යන්තම් කිරිපිටි තියන කඩේ ඉස්සරහ පෝලිම් ගැහුනම පොලොස් කොට්ටෝරුවෝ බැණ බැණ එලවනවා. වල් ලෝ. වල් කන්ට්‍රි.*

*රාජ (ඇ)මැට්ටෙක්ට, රූප රාජිනියක් කියලා මෝල් ගහ පෙන්නන්න කියලා. කරටි කැඩෙන්න බීලා හිටපු මූට ඇහිලා තියෙන්නේ එල්ලුම් ගහ කියලා. මූ රෑ ජාමේ අහසින් වැඩලා සිපිරි ගෙට. ජේලර්ලා වට කරගෙන බණත් දෙසලා. සැකකරුවෙක්ගේ ඔලුවට පිස්තෝලේ තියලා ආශිර්වාදත් කරලා. පහුවෙනිදා මීඩියාකාරයෝ හොඳට වර්ණනා කරලා කිව්වා මේකගේ ගුණ කඳ. ලොකු තැන හිටගෙන කරද්දී, ගෝලයෝ දුව දුව කරනවා කියන්නේ ඕකට තමයි. අන්තිමට ලොකු තැන බේරගන්න මූත් සෙට් උණා කියහන්කෝ ඉල්ලා අස්වීමේ පෙරහැරට. හැබැයි හිතකින් නෙමෙයි. වෙන කරන්න දෙයක් නැති කමට. කොහොමත් එකක් නැති උනාට මූට තව එව්වා තියෙනවා. ඒ නිසා ඉල්ලා අස් උනත් ඌ තාම රාජ (ඇ)මැට්ටා.*

*ආදරණීය සුනිල් අයියත් යන්න ගියා. හැබැයි ගොඩාක් හොඳ මතක ඉතිරි කරලා. තමන්ට ඇති පදම් සල්ලි තිබ්බත් හිත හොඳ සුනිල් අයියා හුදී ජනයා වෙනුවෙන් කතා කළා. හොර තක්කඩි නායකයින්ට ප්‍රශස්ති කිය කිය පුද්ගලික වාසි ගන්න දඟලන බහුතරයක් ලිලිපුට් නලාකරුවෝ ඉස්සරහ, සුනිල් අයියා යෝධ ගලිවරයෙක්ම තමයි. ඔහු මේ රට ගැන සුභ සිහින දැක්කා. මේ රටේ තරුණ තරුණියන්ට අභිමානයෙන් ජීවත් වෙන්න පුලුවන් රටක් ගැන සිහින මැව්වා. එහෙව් රටක් නොබෝ කලකින් SYU කෙල්ලෝ කොල්ලෝ එකතුවෙලා හදයි කියලා සරදියෙල්ටනම් විශ්වාසයි.*

*නූතන පරපුරේ සරදියෙල්*

ජීවය බිහිවෙයි

වසර 300ක් පමණ හුදකලාව සිටි පෘථිවියේ ජීවය කෙසේ ආරම්භ වී දැයි අපි අද දැනුම ලිපියෙන් සොයා බලමු.

# පෘථිවියේ ජීවය බිහිවෙයි

වසර මිලියන 3500කට පමණ පෙර කාලය වන විට නොගැඹුරු සාගර ජලයේ අපූරු සංසිද්ධියක් සිදුවෙමින් පැවතිණ. එනම් ජීවයේ පුරෝගාමීන් වූ ඒකසෛලික ජීවීන් බිහිවීමයි. මෙම ජීවය බිහිකිරීම සඳහා අවශ්‍ය පරිසරය වසර මිලියන ගණනාවක රසායනික ක්‍රියාකාරීත්වය මගින් සකස්ව තිබිණි. එනම් පොළොව මධ්‍යයේ වූ විශාල කැලඹීම් හේතුකොට ගෙන පෘථිවිය තුළ සැඟව තිබූ ඛනිජ ද්‍රව්‍ය මෙන්ම කාබන්ඩයොක්සයිඩ්, මීතෙන් වැනි වායූන්ද එකිනෙක හා ප්‍රතික්‍රියා කිරීමෙන් ජීවය බිහිවීම සඳහා අවශ්‍ය ඇමයිනො අම්ල හා ප්‍රෝටීන් පදාර්ථ බිහිවූ බව විද්‍යාඥයින් විසින් හෙළිකොට තිබේ. සොබාදහමේ අතිශය සුවිශේෂී ක්‍රියාවලියක් නිසා එලෙස බිහිවූ ඒකසෛලික ජීවීහු නිසරු බිම්කඩ වටකොට ගත් මහ සයුර ජීවයෙන් පුරවන්නට දිවා රෑ නොතකා වෙහෙසුනහ...

මෙම මුල්ම ජීවී සෛලයන් න්‍යෂ්ටියක් නොදැරීය. ඔවුන්ට ජීවත්වීම සඳහා ඔක්සිජන්ද අවශ්‍ය නොවීය. එපමණක්ද නොව, එවකට පැවති දැඩි උෂ්ණත්ව තත්වයන්ට ඔරොත්තු දීමටද ඔවුන්ට ශක්තිය තිබිණි. තමා වට කොටගත් ජලයේ දියව තිබූ ඛනිජ ද්‍රව්‍ය උරාගනිමින් වර්ධනය වූ න්‍යෂ්ටියක් රහිත මෙම ඒකසෛලීය ජීවීන් බෝවූයේ දෙකඩ වී එක් එක් අර්ධය පූර්ණ සෛල ලෙස නැවත නැවත වර්ධනය වීම මගිනි. බැක්ටීරියාවල ආදිවාසීන් වූ මෙම ඒකසෛලීය ජීවීහු වසර මිලියන 250ක් පමණ පුරා මෙදිියත රජ කළහ.

කල්යත්ම රසායනික ක්‍රියාවලිය මගින් ආහාර ජීරණය කරගැනීමෙන් ශක්තිය ලබාගත් මෙම ජීවීන්ගේ ගමනේ ඊළඟ පියවර වූයේ හිරුඑළිය උපයෝගී කොට ගෙන (ප්‍රභාසංස්ලේෂණය) ආහාර ජීරණය කර ගැනීමේ ශක්තියෙන් යුත් නව පරපුරක් බිහිකිරීමයි. මෙම නව පරපුරේ ජීවීහු ප්‍රභාසංස්ලේෂණය මගින් වාතයේ ඇති කාබන්ඩයොක්සයිඩ් උරාගනිමින් ඔක්සිජන් වායුව වා තලයට නිකුත් කරන්නට වූහ. මුහුදු පත්ලෙහි තැන්පත්ව පොසිලගත වී ඇති ප්‍රාග් න්‍යෂ්ටික ක්ෂුද්‍ර ජීවී පරපුරක් වන මෙම ජීවීන්ගේ පොසිල ස්ට්‍රොමැටලයිට්පොසිල යනුවෙන් හැඳින්වේ. මෙම පොසිල බිහිවී ඇත්තේ ක්ෂුද්‍ර ජීවීන් අනන්ත අප්‍රමාණ සංඛ්‍යාවක් එක මත තැම්පත් වීමෙනි. එවක කෙතරම් නම් විශාල ජීවී සංඛ්‍යාවක් ජලතරලය අරක්ගෙන සිටියේද යන්නට මෙම පොසිල කඳු දෙස් දෙයි.

පියවි ඇසින් නොදැකිය හැකි තරම් කුඩා වුවත් ඔවුන් කළ මේ හපන්කම එසේ මෙසේ එකක් නොවීය. එක් අතකින් එය අනාගත දියුණු ජීවීන් බිහිවීමට අවශ්‍යව තිබූ මූල සාධකයක් වූ ඔක්සිජන් වායුව සැපයීමක් විය. මුල් අවදියේ වායුගෝලයේ 1%කටත් වඩා අඩු මට්ටමින් පැවති ඔක්සිජන් වායු අනුපාතය වසර බිලියන 1000ක් පමණ තුළදී 11%ක් තරම් වැඩි කරන්නට මේ කුඩා ජීවීහු සමත් වූහ.

**ප්‍රොටෙරොසොයික් අවදිය (වර්ෂ මිලියන 2500කට පෙර සිට මිලියන 544කට පෙර දක්වා)**


ප්‍රාග් කේම්බ්‍රීය කාලාන්තරයට අයත් අවසාන වසර මිලියන දෙදහසක පමණ වූ කාල පරිච්ඡේදය ප්‍රොටෙරොසොයික් අවදිය ලෙස හැඳින්වේ. මෙම කාල පරිච්ඡේදය පෘථිවියේ මුළු වයසින් අඩකට වඩා අඩු වන්නේ යන්තමිනි.

ප්‍රොටෙරොසොයික යන්නෙන් අදහස් වන්නේ ප්‍රාග් ජීවී යන්නයි. ලෝකය ජනාවාස නව ජීවීන්ගේ සම්භවයට අවශ්‍ය පරිසරය බිහිකිරීම සඳහා මිහිකත සිය වයසින් අඩකට ආසන්න කාලයක් ගත කළාය. එම මහා ප්‍රයත්නය මල්ඵල ගැණුනේ එවක ජලය වාසය කොට ගෙන සිටි පියවි ඇසට නොපෙනෙන තරම් කුඩා ප්‍රාග් ජීවී පරපුරේ සහාය නොමඳව ඇයට ලැබුණු හෙයිනි.

පෘථිවියේ මුල්ම අයිතිකරුවන් වන, අපේ ආදිතම මුතුන් මිත්තන් වන මෙම ජීවීන් මින් ඉදිරියට සම්භවය වන ආකාරය පිළිබඳව අපි මීළඟ කලාපයෙන් දැනගනිමු.

## bookiයෙන්



The Gadget



# Titan security key ආරක්ෂාව වැඩි කරගන්න

වර්තමානයේදී මිනිස් ජීවිත ප්‍රබලව තාක්ෂණය හා බැඳී පවතින්නේ ඉතාමත් සංකීර්ණ වූ දත්ත හරහාය. මෙනිසා අපගේ පෞද්ගලිකත්වයට ප්‍රබල අවදානයක් ලබාදීමට සිදුවනවා. මෙයට විසඳුමක් ලෙස Google සමාගම විසින් "Titan two-factor authorization security key" එක හඳුන්වාදී තිබෙනවා. පරිඝණකයේ, දුරකතනයේ විශේෂ දේවල් සඟවා තැබීමට භාවිත කරන Passwords" Security Patterns වලට විකල්පයක් ලෙසයි මෙය වෙළඳපොළට නිකුත් වන්නේ. මෙය Pendrive එකක් ලෙස මෙන්ම NFC සහ Bluetooth යන ඕනෑම ආකාරයකින්ද සම්බන්ද කළ හැකිය.

# reMarkable Paper Tablet ඩිජිටල් නොවන හැඟීමක්



කොලයයි පැනයි එක්ක කරන සමහර ගණුදෙනු තාක්ෂණය කොතරම් තිබුණත් ඒ හරහා කරද්දි තවමත් අපට යම් දුරස්ථභාවයක් දැනෙනවා. මෙයට එක් හේතුවක් වන්නේ කොලය, පැන, සටහන අතර අපට තිබෙන හැඟීම. ඉතින් මේ හැඟීම දැනෙන ඩිජිටල් නිෂ්පාදනයක් මේ වනවිට වෙළඳපොළට නිකුත්වෙලා. ඒ තමයි "reMarkable Paper Tablet" එක. "reMarkable" කියන්නේ අපි කඩදාසියක ලියනවා වගේ දැනෙන හැඟෙන එකම ඩිජිටල් උපාංගය. සටහන් සකස්කරගන්න, කියවන්න, review කරන්න පහසුවෙන්ම පුලුවන්. මේ උපාංගය භාවිතා කරද්දි අපිට දැනෙන්නේ ඇත්තටම පොතක, කොලයක ලියනවා වගේ.



# Energizer phone එක චාර්ජ් එකෙන් දවස් 50ක්

Avenir Telecomys Energizer ජංගම දුරකතන සමුළුවේදී (MWC) ස්මාර්ට් ජංගම දුරකතනයක් එළිදක්වා ඇති අතර එහි බැටරි ධාරිතාව 18,000ප්‍ය වේ. මෙය වර්තමාන ස්මාර්ට්ෆෝන්වලට වඩා තුන්ගුණයක් පමණ ඝනකමින් යුක්තය. මෙහි විශේෂිතම ලක්ෂණයක් වන්නේ වරක් ආරෝපණය කළ පසු එහි බැටරිය දින 50ක් දක්වා තිබීමයි.

# EnGoPlanet Smart Solar Bench ස්මාර්ට් නැවතුම්පොළ



EnGoPlanet Smart Solar Bench යනු උසස් යැයි සලකන බොහෝ රටවල දැකිය හැකි ස්මාර්ට් සිටි සංකල්පයකි. ඔබ සාමාන්‍යයෙන් දකින නාගරික Benchවල අපට ලැබෙන එකම පහසුව වන්නේ වාඩි වී සිටීමය. නමත් මෙම Smart Bench එක විශේෂිත වන්නේ දුරකථනය හෝ ටැබ්ලටය නොමිලේ ආරෝපණය කරගැනීමට, වයි-ෆයි ජාලයකට නොමිලේ ප්‍රවේශ වීමට හැකිවීම, LED ආලෝකය රාත්‍රී කාලයේ නිසැකවම ලැබීම සහ මහජන ආරක්ෂාව සඳහා සීසීටීවී කැමරා සහ SOS බොත්තම ඇතුළත් වීම වැනි කරුණු හේතුවෙනි.

# UNIT 1 FARO (A Sleek Visibility-First Smart Helmet) ආරක්ෂාව සහ සුවපහසුව



වීදියේදි පාපැදි පැදවීමේදී අනතුරු බොහෝ විට සිදුවන්නේ පෙනීම නොමැතිකම සහ නොපැහැදිලි සන්නිවේදනය හේතුවෙනි. අනෙකුත් රියදුරන් ඔබව හොඳින් නොදැකීම හෝ ඔබ ඊළඟට කුමක් කරන්න යන්නේද යන්න නොදැන සිටීම නිසාවෙනි. UNIT 1 FARO ජාත්‍යන්තර සහතික කිරීමේ ප්‍රමිතීන්ට අනුකූලව සැලසුම් කර ඇත. මෙහි විශේෂත්වය වන්නේ ඔබ යන දිශාව අලෝක පද්ධති මගින් අනෙකුත් රියදුරන්ට හැඟවීම, MIPS සහ වැටීම් හඳුනාගැනීමත් සමඟ ආරක්ෂාව සහ සුවපහසුව ලබා දෙන ස්මාර්ට් හිස් ආවරණයක් වීමයි.

# පෘථිවියේ පැවැත්මට මිනිසා අවශ්‍යද?



කිසිසේත්ම නැත. ලෝකය පැවතීමට සහ ඉදිරියට පවත්වාගෙන යාමට ඇසට නොපෙනෙන පාංශු ක්ෂුද්‍ර ජීවියෙක්ගේ පැවැත්ම ඊට වඩා ලෝකයට වටී සහ ලෝකයට අවශ්‍යය. ඔබට මේ ගැන ටිකක් විස්තර කරන්න අපි ඉදිරිපත් කරනවා කායික විද්‍යාව පිළිබඳ නොබෙල් ත්‍යාගය දිනාගත් සහ මේ යුගයේ විශිෂ්ටතම පාංශු ක්ෂුද්‍ර ජීවී



විශේෂඥ රුසියානු ජාතික සෙල්මන් ඒ වොක්ස්මන්ව. ඔහු සොයමින් සිටියේ සහ සොයාගත්තේ ක්ෂුද්‍ර ජීවීන් දසදහස් ගණනක් අතරින් එක් පාංශු ක්ෂුද්‍ර ජීවියෙකු වූ ස්ට්‍රෙප්ටොමයිසින් ග්‍රිසියස් නැමති බැක්ටීරියාවයි. එය ක්ෂුද්‍ර රෝග බැසිලස විනාශ කිරීමේ හැකියාවෙන් අනූන වූ අතර මිනිසුන් තුළ පරීක්ෂා කිරීමට තරම් ආරක්ෂිත විය. පසුකාලීන සායනික අත්හදාබැලීම් වලින් තහවුරු වූයේ ස්ට්‍රෙප්ටොමයිසින් ක්ෂය රෝග වර්ග කිහිපයක් සුව කළ හැකි බවත් විවිධ බැක්ටීරියා ආසාදන සඳහා නිර්දේශ කිරීමට තරම් එය ආරක්ෂිත බවත්ය. එය සොයාගෙන වසර හැටකට පසුවත්, ක්ෂය රෝගය සහ ජීවිතයට තර්ජනයක් වන වෙනත් ආසාදනවලට එරෙහි සටනේදී ස්ට්‍රෙප්ටොමයිසින් අඛණ්ඩව තවමත් භාවිතා කෙරේ. සෙල්මන් ඒබ්‍රහම් වක්ස්මන් (1888-1973) ස්ට්‍රෙප්ටොමයිසින් සොයාගැනීම සඳහා 1952දී කායික විද්‍යාව හෝ වෛද්‍ය විද්‍යාව සඳහා වූ නොබෙල් ත්‍යාගය ලබාගත් විද්‍යාඥයා විය. වොක්ස්මන් යුදෙව් ජාතිකයෙකි. ඔහු රුසියාවේ කීව් නුවර ඉපදුනමුත් සේවය කළේ සහ මියගියේ ඇමෙරිකා එක්සත් ජනපදයේය. පහත දැක්වෙන්නේ මේ මහා පුරුෂයා සමග රිඩර්ස් ඩයජස්ට් සඟරාව ඉදිරිපත් කළ කරුණු කිහිපයකි.

''මේ මහ පොළොව මත ක්ෂුද්‍ර ජීවීන් කොපමණ සංඛ්‍යාවක් සිටීදැයි කිසිවෙක් නොදනී. ඊට තව තවත් නාඳුනනා ක්ෂුද්‍ර ජීවීන් වසරින් වසරට අලුතෙන් එක්වෙයි. කෙසේ නමුත් ඔවුන් මේ මහපොළොව මත ජීවත්වන සෙසු සියලු ජීවීන්ගේ එකතුවටත් වඩා සංඛ්‍යාත්මකව විශාලයි. සරල උදාහරණයක් ගත්තොත් ඔබ තේ හැන්දකට ගන්නා පස් ස්වල්පයක ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනගහනයටත් වඩා වැඩි ක්ෂුද්‍ර ජීවීන් සංඛ්‍යාවක් සිටී. පියවි ඇසට නොපෙනෙන තරම් කුඩා වූ මෙම ජීවීන් ලෝකයටත් මිනිසාටත් ඔවුන් කරනු ලබන බලපෑම අපි විස්තර කර ගමු.

මේ එක් ක්ෂුද්‍ර ජීවියෙකුට තියෙනව ඔවුන්ගේම ප්‍රභේද ගණනාවක්. මේ හැම එකාටම තමන්ට ආවේණික මුවක්, ආමාශයක් හෝ ජීර්ණ පද්ධතියක් නෑ. මෙහෙම තියෙන්නෙ ප්‍රොටෝසෝවන්ට පමණයි. ඔවුන්ගේ මුලු ශරීරයම හැදිල තියෙන්නෙ එක සෛලයකින්. උන් ශරීරයේ සෑම තැනකින්ම ආහාර ගන්නවා, ජීර්ණය කරනවා, පිටතට දමනවා. මේ ක්ෂුද්‍ර ජීවියා මිනිසාට බොහෝ විෂ සහිත ආහාර ආහාරයට ගන්නවා. එහෙත් ඒවා ඔවුනගේ ජීර්ණයෙදී සුදුසු ලෙස රසායනිකව සංයෝගවී සහ හැඩගැසී මිනිසාට සේවය කරනු ලබයි. උන්ගෙන් සමහරෙක් ආහාරයට ගන්නේ හයිඩ්‍රජන් සල්ෆයිට් වායුවයි. තවත් සමහරෙක් කාබන්මොනොක්සයිඩ් විෂ වායුව ආහාරයට ගනී. තවත් උන් කාබොලික් ඇසිඩ් වායුව ආහාරයට ගනී. එහෙත් ඔවුහු පිටකරන්නේ මිනිසාට අතිශය මහෝපකාරී ද්‍රව්‍යන් සමූහයකි. ඒවා මිනිසාට අත්‍යවශ්‍ය ඖෂධ බවට පරිවර්තනය කරන්නේ ඔවුන්ය. පෙනිසිලින්, ක්ලෝරමයිටිසීන්, ඔරියෝමයිසීන්, ස්ට්‍රෙප්ටොමයිසීන් මින් සමහරක්. ඊස්ට් නැමති ක්ෂුද්‍ර ජීවියා මිදි වයින් බවට පරිවර්තනය කරයි.

මේ සියල්ලටමත් වඩා ඔවුහු මේ මහ පොළොවේ පැවත්මට මහා කාර්යභාරයක් කරති. මනුෂ්‍යයා සහ සියලු සත්වයන් ආහාරයට ගනු ලබන්නේ ශාක හෝ මාංශය. මාංශවලින් පමණක් ජීවත්වන සතුන්ද ආහාරයට ගන්නේ ශාකවලින් පෝෂණය වන සතුන්වය. එහෙයින් මේ සියල්ලන් අවසානයේ යැපෙන්නේ ශාකවලිනි. ශාක නොමැති නම් මේ කිසිවෙකුට පැවත්මක් නොමැත. මේ සියලු ශාක වර්ග ජීවත්වන්නේ මැරී දිරාපත් වූ වෙනත් ශාක හෝ සත්වයන් ආහාරයට ගනිමිනි. එහෙත් මේ සියලුම ශාකවලට සෘජුවම හා තනිවම කිසිවක් ආහාරයට ගත නොහැකිය. මොකද එයාලට කටක් නෑ.

කට තමයි මුල්.

මෙන්න මේ වෙලාවට තමයි එයාලට මේ ක්ෂුද්‍ර ජීවීන්ගේ උදව්ව ඕන. මේ ක්ෂුද්‍ර ජීවියො කරන්නෙ එයාලට ඇගේ හැමතැනම කටවල් තියෙන නිසා මළ ශාක හා මාංශ කොටස් ආහාරයට ගනිමින් එම සංකීර්ණ ශාක හා මාංශ සරල අණු දක්වා පරිවර්තනය කර සියලුම වෘක්ෂලතාවල මුල්වලට දියර වශයෙන් හලන එක. මෙන්න මේ දියරය තමයි සියලු ශාක ආහාරයට ගන්නෙ. ඒ කියන්නේ සියලුම ගහකොළ ජීවත්වෙන්නෙ මේ ක්ෂුද්‍ර ජීවීන් පිටකරන කසල එහෙමත් නැත්නම් මළපහ ආහාරයට ගනිමින්. කවදාහරි දවසක මේ ක්ෂුද්‍ර ජීවීන් වඳ වෙනවා කියන්නෙ මුලු පෘථිවියේම ගහකොළ තමන්ට ආහාර ගත නොහැකිව මිය යනවා කියන එක. ඒ අනුව මිනිසා ඇතුලු සත්ව සංහතියම මියයනවා කියන එක.

ඉතින් ඔබට තේරෙන්නෙ ඕන මේ ග්‍රහලෝකය පවතින්නෙ මේ ක්ෂුද්‍ර ජීවීන් නිසා කියන එක. ඒත් අපේ එදිනෙදා දින චර්යාව තුළ මේ ජීවීන් තුට්ටුවකටවත් ගණන් ගන්නවද? නෑ! එහෙම තමයි අපේ හැටි. ඒත් ලෝකයේ විශිෂ්ඨ මිනිස්සු මේ සත්තු වෙනුවෙන් කැපවෙලා ඉන්නව. උන් ගැන නිරන්තරයෙන් පරීක්ෂණය කරනවා නිරීක්ෂණය කරනවා. නමුත් වසර ගණනක් මහන්සි වුණත් මේ ශ්‍රේෂ්ඨ මිනිසුන් හඳුනාගෙන තියෙන්නේ ක්ෂුද්‍ර ජීවීන් අතේ ඇඟිලි ගණනටත් අඩුවෙන්. බැක්ටීරියා, වෛරස්, ප්‍රොටෝසෝවා, දිලීර, ඇල්ගී, මින් කිහිපදෙනෙක්. එත් තව හඳුනා නොගත් වර්ග දහස් ගණනාවක් තියෙනවා.

] උපාලි ජයසිංහ [

# කවි නිම්නය


**ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්**
ඔබගේ කවි නිර්මාණ අප වෙත එවන්න.
අප සූදානම් ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්
FORWARD කවි පිටුවේ වෙන් කරන්න.

මෙන්න අපගේ ලිපිනය

FORWARD කවි පිටුව,
අංක464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
syuforwardnews@gmail.com


## මිහිමත යම් තැනක..

තාම උඹ ඉස්සර වගේම ද...?
වායුගෝලය මැදින් එබිලා,
දේශසීමා කඩා බිඳලා
දවල් තිස්සේ එළිය දෙනවද....?

හායි කොහොමද ඉතින් පුන්සඳ... ?
අරයා රැස් ඇතිවෙන්න දෙනවද...?
හා පැටවු උකුලේ තියාගෙන
වළා බැම් අතරින් එබීලා,
ලෝක යායට සිසිල බෙදුවද...?

මචං මඳනල උඹට ඇහුණද..?
තාම ලෝකේ වටේ යනවද....?
එකෙක් පිටකළ හුස්ම අහුරක්
මෙකී මිහිපිට මත්තෙ වසනා
අෑත එකෙකුට ගිහින් දෙනවද....?

අපේ උන් ද?.....
කතා කරලා වැඩක් නෑ ....

ජාතියට කෙලගන්නවා මුන්
ආගමට කෙලගන්නවා...
සතා සීපා නසා දමලා
කැලෑවට ගිනිතියනවා...

එපා කිව්වට අහන්නෙ ම නෑ
හෙනට ආයුද හදනවා...
වැඩක් නෑ බං කතා කරලා
අපේ උන් ලොව බදනවා..

ආ තව දෙයක් ..

පොළොව බෙදලා හුඟක් කල් දැන්
මුහුදෙ වතුරත් කෑලි කපලා....
අනාගතයෙදි අහස අල්ලා
බෙදාගයි මුන් කොටස් කරලා....

හ්ම්ම්..
ඒ තමයි මිනිස්සු..

] **පසිඳු විජේනායක - හම්බන්තොට** [

## මෙඩූසා

ඔලිම්පස් කන්ද මත
ඇගෙ යැදුම් පර විණි
දෙවොලෙ උස කණු පවා
සොව හන්දා වැළපෙද්දි..

වරළ අග සර්ප හිස්
සීරුවට මතුවී
දෙපතුල් පවා මැකීගොස්
අෑව බිම වැටිණී..

ඕ ලොවම කැපකළ
අල්තාරයේ මත්තේ
දෑස් රඳවා සුසුම්ලෑවා
දෙවිවරුන් නොදුටුවා..

සියවස් ගණන් ගත වුවත්
ඇගෙ හැඬුම් අදටත්
ඇතැන්ස් හී හවස් වල
ගැහැණුන්ට ඇහෙනවා..

] **සඳුනි නුවන්තිකා - කොළඹ** [



## වියැකෙන සයුර

දිලෙන වග සුමුදු වැලි,
සිප්පි කටු හක්ගෙඩි,
නොදැක වුව දනී නුඹ,
ඒ සොඳුරු වෙරළ වග..

නඟන බව රැළි පෙරළි,
ඇහෙන බව හෝ හඬ,
නොදැක වුව දනී නුඹ,
ඒ මහා සයුර වග....

කොරල් පර මුතු පරද,
නේක විද මත්ස්‍යයෝ,
දිය මෙන්ම ගොඩ වෙසෙන,
කැස්බෑවො උරගයෝ...

ඩොල්ෆින්ද තල්මස්සු,
තව මුහුදු අශ්වයෝ,
කවදාක නොදුටුවත්,
නුඹ දන්න ජීවියෝ...

බිදෙන රළ රැලි යටින්,
නුඹ නොදුටු විශ්වයකි,
ආහාර ඔක්සිජන්,
දෙන ජීව ලෝකයකි....

පොලිතීන් ප්ලාස්ටික්,
ලී යකඩ ඛනිජ තෙල්,
විෂ රසායනික සහ,
අපද්‍රව්‍ය විවිධ වූ....

දූෂණය කරන වග,
ජල ශාක ජීවීන්,
අපිට දෙන හුස්ම පොද,
මේ සොදුරු විශ්වයම....

තහනම් වු මාළු දැල්,
මුදාහැරි විකිරණද,
කම්හලක අපද්‍රව්‍ය,
හානි වෙයි කඩොලාන ...

ඝණ වුවත් ද්‍රව වුවත්,
අපද්‍රව්‍ය ටොන් ගණන්,
හිරු එළිය නොවැටීම,
ජල ශාක මිය ගිහින්....

ආහාර නැති කමින්,
මත්ස්‍යයෝ මිය ගිහින්,
පොලිතීන් ගිල බැලූ,
තව සත්තු මිය ගිහින්...

මහ සයුර ඔබේ නොව,
විශ්වයේ අයිතියක්,
වියැකෙනා මේ සයුර,
රැකගැන්ම යුතුකමක්...

] **නුවනි කුමාරසිංහ**
**කුරුණෑගල** [

## නිදසුනක් ඇත කියා දෙන්නට පෙල පොතේ නැති පාඩමක

හඬන උන් - වැළපෙන එවුන්
නිදා වැටිලා - යදින උන්
මහමෙරක් හිස මුදුනෙ රඳවා
කාලයට ඉඩ තබන උන්
අකැප බව බුදු රජුන් දෙසුවත්
දැන දැනම රැක් වදින උන්
අතරමං ජීවිතේ නැතිකර
ප්‍රශ්න විසඳයි අපේ උන්

අඳුර රජවුණ ලෝකයට
අවැසිය නව සිහිනයක්...
හැබෑ නොවනා සිහිනයක් නොව
හැබෑවන නව හෙට දිනක්...

නොමර මර මර සිහින මිරිකා
අපිව අන්දන ටිකක් උන්...
සිහින මාලිගා වලත් මාලිග
හදන් ඇත නුබ නිසා උන්...

මන්ද යැද යැද අයැද උන් ළඟ
නැගිටහන් හිරිගඩු ඇරන්...
යතුර නුඹමයි නුඹේ සිහිනයේ
වරෙන් ගමනක් යමු ඉතින්...

නිදසුනක් ඇත කියා දෙන්නට
පෙළපොතේ නැති පාඩමක්...
නුඹ නිසා ඇස් දෙක පියාගත්
සොහොයුරන්ගේ කතාවක්...

] **භාෂණ ජයලත් - කැකිරාව** [

## මෙයාලැයි ඉදිරි මග මේකයි

හරියටම නැති වෙන්නෙ
දැනගත්ත දාටයි
එදාට උඹලා අපි
ඔක්කොටම
දෙයියන්ගෙ පිහිටයි..
මුට්ටි පැණි සමගින්ම
පවිත්‍රත් හමාරයි
දැන් රටේ සෞඛ්‍යය
කෙහෙළියට බාරයි...

සිනී බද්දෙන් උනත්
අපිට හෙණ ලාභයි..
බද්ධ කෑ මුදලාලි
ගජ මිතුරු නානයි
ඇන්ටිජන් කිට් වලින්
උනත් උන් හූරයි..
කොරෝනා සමග යන
ඉදිරි මග මේකයි..

] **ඇන්ටන් සමන්**
**පුත්තලම** [

# පේරු රාජ්‍ය සමාජවාදය වෙත කැඳවාගෙන යන ගුරුවරයා




පසුගියදා පැවති පේරු ජනාධිපතිවරණයේදී පේද්රෝ කැස්ට්ලෝගේ ජයග්‍රහණය ඇන්ඩියන් කලාපයේ විශාල දේශපාලන භූමිකම්පාවක් ඇති කරන ලදී. මෙමගින් ඇන්ඩියන් කලාපයේ දැවැන්ත සමාජ හා දේශපාලන ධ්‍රැවීකරණය මනාව පිළිබිඹු වේ. මාක්ස්වාදී, ලෙනින්වාදී සහ මාරියා ගුස්ට්වාදියෙකු ලෙස හැඳින්වෙන පෙරී ලිබ්රේ නම් පක්ෂ නායකත්වය දරණ සටන්කාමී ගුරු වෘත්තීය සමිතිවාදියෙකු පිටුපස පෙළ ගැසුණු පේරු ජනතාව විසින් පාලක පන්තිය දැවැන්ත පරාජයකට පත් කොට ඇත.

කෙසේ වෙතත්, ඔහුගේ මැතිවරණ ජයග්‍රහණය අහම්බයක් නොවේ. එය පේරු රාජ්‍යයේ පාලන තන්ත්‍රයේ ගැඹුරු අර්බුදයේ ප්‍රකාශනයකි. ඛනිජ සම්පත්වලින් අතිශයින් පොහොසත් රටක් මෙන්ම ලෝකයේ දෙවන විශාලතම තඹ නිෂ්පාදකයා වන රටක, දශක ගණනාවක පෞද්ගලිකරණය හා ලිබරල්කරණය පිළිබඳ කම්කරු විරෝධී ප්‍රතිපත්ති, ධනය බෙදීයාමේ පවතින අන්ත විෂමතාව සහ දූෂණය මත පදනම් වූ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය පේරු රාජ්‍යට මෙම පාලක පන්තිය ලබා දී ඇති උරුමයන් වේ.

හිටපු ජනාධිපතිවරු පස්දෙනෙක් එක්කෝ සිරගතව හෝ දූෂණ චෝදනාවට වරදකරුවන් වී සිටිති. ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ සියලුම ආයතන අතිශයින් අපකීර්තියට පත් වී ඇත. 2020 නොවැම්බරයේ පැවති මහා පෙළපාලි යනු පේරු සමාජය තුළ රැස් වූ දැඩි කෝපයේ ප්‍රකාශනයක් වේ. එපමණක් නොව කොවිඩ්-19 වසංගතයේ හා ධනේශ්වර අර්බුදයේ බලපෑම එකතු වූ කල පේරු වැසියන් ලතින් ඇමරිකාවේ නරකම ආර්ථික හැකිලීමකින් පීඩාවකට පත් වූ අතර, ලොව ඕනෑම තැනක නරකම අතිරික්ත මරණ අනුපාතය සහ නරකම මරණ අනුපාතය එරටින් වාර්තා කර ඇත.

මෙම වටපිටාව තුල පේරුහි කම්කරුවන්ට සහ ගොවී ජනතාවට රැඩිකල් වෙනසක් අවශ්‍ය වූ අතර පේද්රෝ කැස්ට්ලෝ ඔවුන්ගේ එම බලපොරෝතුවේ නියෝජනය විය. "පොහොසත් රටක දුප්පත් ජනතාව තවදුරටත් නැත" යන කැස්ට්ලෝ මැතිවරණ සටන්පාඨය විය. මෙම "ගුරුවරයාගේ වචනය" පීඩිතයින්, කම්කරුවන්, දුප්පතුන්, ගොවීන්, පීඩිතයින්, ස්වදේශික ජනයා සහ අයිමාරා යන අය තුළ දෝංකාර දුන්නේය.

කැස්ට්ලෝගේ ආගමනය සිදුවන්නේ 2017 ගුරු වර්ජනයට නායකත්වය දීම සඳහා වෘත්තීය සමිති නිලධාරී තන්ත්‍රය නොසලකා හැරීමෙනි. කම්කරුවන්ට සහ ගොවීන්ට ඔහු ඔවුන්ගේම කෙනෙකි. ඔහු ජනාධිපති ධූරයට පත් වූ විට තම ගුරු වැටුපෙන් ජීවත් වන බවට පොරොන්දු වූ ග්‍රාමීය ගුරුවරයෙකි. ඔහුගේ ජනප්‍රියතාවය තුළින් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය සහ පේරුහි සියලු දේශපාලන පක්ෂ ගැඹුරු අපකීර්තියට පත්කිරීමක් හෙළිදරව් කරයි.

කීකෝ ෆුජිමෝරි ඔවුන්ගේ ප්‍රියතම අපේක්ෂකයා නොවූවද, දෙවන වටයේදී මුළු පේරු පාලක පන්තියම ඇය පසුපසින් සිටියහ. ඔවුන්ගේ උද්ඝෝෂණය දරුණු විය. ලීමාවේ දැන්වීම් පුවරු "කොමියුනිස්ට්වාදය යනු දුප්පත්කම" ලෙස ප්‍රකාශයට පත් කළ අතර කැස්ට්ලෝ මැතිවරණය ජයග්‍රහණය කළ හොත් ඇතිවිය හැකි වසංගත හත ගැන ජනතාවට තර්ජනය කරන ලදී.

අතීතයේදී ධනපති ලිබරල් දෘෂ්ටි කෝණයකින් ඇල්බර්ටෝ ෆුජිමෝරිගේ පාලනයට විරුද්ධ වූ නොබෙල් ත්‍යාගලාභී වර්ගාස් ලෝසා, කැස්ට්ලෝගේ ජයග්‍රහණය ප්‍රජාතන්ත්‍රවාදයේ අවසානය බව ප්‍රකාශ කරන ලදී. අතිවිශිෂ්ට නිර්මාණකරුවාගේ මතය පරාජය කරමින් අන්තර්ජාතික මැතිවරණ නිරීක්ෂකයන් කැස්ට්ලෝගේ ජයග්‍රහණය කිසිදු වංචාවකින් තොර බවට සහතික කරන ලදී. ඒ අනුව පේරු මැතිවරණ ජූරි සභාව 2021 ජනාධිපතිවරණයෙන් පෙද්රෝ කැස්ට්ලෝ ජයග්‍රහණය කර ඇති බව නිවේදනය නිකුත් කිරීමත් සමඟ පසුගිය ජූලි 28 වන දින ගුරු සංගම් නායකයා පේරුහි ජනාධිපති ලෙස දිවුරුම් දෙන ලදී.

කෙසේවෙතත් මෙම තියුණු ජයග්‍රහණය, රටේ පවතින තියුණු පන්ති ද්‍රවිකරණය පෙන්වූ කැඩපතක් විය. මෙමඟින් අපට කැස්ට්ලෝට ඉදිරියේදී මුහුණදීමට සිදු වන දේ පිළිබඳ ඇඟවීමක් ලබා දේ. පේරු ලිබ්රේගේ ලේඛනවල මාක්ස්, ලෙනින් සහ මරියටෙගුයි ගැන සඳහනක් තිබුණත් කැස්ට්ලෝගේ වැඩසටහන ජාතික ධනවාදී සංවර්ධනයකි. ඔහුට අවශ්‍ය වන්නේ රටේ ඛනිජ සම්පත් සමාජ වැඩසටහන් (ප්‍රධාන වශයෙන් අධ්‍යපනය) සඳහා යොදාගැනීමට සහ "ආර්ථික සංවර්ධනය" සඳහා "එලදායි ජාතික ව්‍යාපාරිකයන්" සමඟ වැඩ කිරීමටය.

ඉක්වදෝරයේ කොරියා සහ බොලිවියාවේ මොරාලස් ඔහුගේ මොඩලයයි. ගැටලුව වන්නේ එවැනි වගකිවයුතු "ජාතික එලදායි" ධනපතියන් නොසිටීමයි. පේරු පාලක පන්තිය, බැංකුකරුවන්, ඉඩම් හිමියන්, ධනපතියන්, බහුජාතික හා අධිරාජ්‍යවාදයේ අවශ්‍යතා සමඟ සමීපව බැඳී සිටිති. ඔවුන් උනන්දු වන්නේ කිසිදු "ජාතික සංවර්ධනයක්" ගැන නොව තමන්ගේ පොහොසත්කම ගැනය.

කැස්ට්ලෝ ඉදිරියේදී උභතෝකෝටිකයකට මුහුණ දෙනු ඇත. එක් අතකට, ඔහුට තේරී පත් වූ කම්කරුවන් හා ගොවීන් සඳහා ඔහු පාලනය කළ හැකි අතර එයින් අදහස් කරන්නේ ධනපතියන් හා බහුජාතික සමාගම් සමඟ රැඩිකල් ලෙස කැඩී යාමයි. එය කළ හැක්කේ පාර්ලිමේන්තුවට බාහිර මහජන බලමුලු ගැන්වීම මත විශ්වාසය තැබීමෙන් පමණි.

කැස්ට්ලෝ විසින්ම මෙසේ ප්‍රකාශ කළේය. "මම මේ මොහොතේ ජාතික ව්‍යාපාරික ප්‍රජාව සමඟ සංවාදයක් පැවැත්වූ අතර එය ජනතාවට සහයෝගය දක්වන බව පෙන්නුම් කරයි. වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ප්‍රජතන්ත්‍රවාදයට ගරු කරන රජයක් අපි නිර්මාණය කරමු. අපි මූල්‍ය සහ ආර්ථික ස්ථාවරත්වයක් ඇති රජයක් නිර්මාණය කරන්නෙමු."

අරගලය ආරම්භ වී ඇත. කැස්ට්ලෝ ගන්නා සෑම ඉදිරි පියවරකටම සහය දැක්විය යුතුය. ඔහුගේ නොසන්සුන්තාවය හෝ පසුබැසීම විවේචනය කළ යුතුය. කම්කරුවන්ට සහ ගොවීන්ට විශ්වාසය තැබිය හැක්කේ තමන්ගේම හමුදාව කෙරෙහි පමණක් වන අතර කතිපයාධිකාරයට එරෙහිව පහරදීමට ඔවුන් බලමුලු ගැන්විය යුතුය. මාරියාටගුයි වරක් පැවසු ලෙස "අපි අධිරාජ්‍ය විරෝධී වන්නේ අපි මාක්ස්වාදීන් වන නිසාත්, අපි විප්ලවවාදීන් වන නිසාත්, ධනවාදයට විරුද්ධ නිසාත්, සමාජවාදය යනු එය සාර්ථක කර ගැනීමට කැඳවූ ප්‍රතිවිරෝධී පද්ධතියක් ලෙසය." ඔහුගේ දෘෂ්ඨි කෝණය වෙන කවරදාටත් වඩා අදට වඩාත් අදාල වේ.

# ආගම බිහිවීම - 08 කොටස

පසුගිය කලාපයෙන් අප ඔබ වෙත ගෙනාවේ මැදපෙරදිගින් බිහි වූ ප්‍රධාන ආගම් තුනේ සමානකම් පිළිබඳවත් මහමත්තුමාගේ උපතට පෙර අරාබිය පිළිබඳවත්ය.

## මහම්මත්තුමාගේ ජීවිතය

ක්‍රි.ව. 570 අප්‍රේල් 22දා මක්කමදී උපත ලැබූ මහම්මත්තුමා ක්වුරයිෂි ගෝත්‍රයේ හෂ්මයිට් පවුලට අයත් විය. අරාබිය පුරා තිබූ භයානක වසංගතයක් අවසන් වීම නිසා එතුමාගේ උපත එක්තරා සුබදායක සිදුවීමක් ලෙස පිළිගැනීමට බොහෝදෙනා පෙළඹුණහ. ඔහුගේ පියා වූයේ අබ්දුල්ලායි. මව අමීනා බින් වහාබ් වූවාය. ඔහුගේ බාල කාලයේදීම ඔහුගේ දෙමව්පියන් මියගිය බැවින් ඔහු රැකබලා ගනු ලැබුවේ ඔහුගේ සීයා සහ මාමා වූ අබුතාලිබ් විසින්ය. සිය දුප්පත්කම හේතුකොටගෙන ඔහුට විධිමත් අධ්‍යාපනයක් ලබාදීමට ඔවුන් අසමත් වූ නමුත් බැටළුවන් සහ ඔටුවන් බලාගැනීමට ඔහුව පුහුණු කරවන ලදී. ඔහුගේ තරුණ කාලය ගත කළේ තවලම් සමඟ අරාබිය සහ සිරියාව වැනි ප්‍රදේශවල සංචාරය කිරීමෙනි. බොහෝදෙනා අතර ඔහු ප්‍රචලිත වූයේ අවංක සහ හිතවත් පුද්ගලයකු වශයෙන්ය. වයස අවුරුදු 24දී වෙළෙඳ කටයුතුවල නියැලී සිටි ධනවත් වැන්දඹු කාන්තාවක් වූ කඩීජාව විවාහ කර ගන්නා ලදී. ඔවුන්ට පුතුන් දෙදෙනෙක් සහ දියණිවරුන් කිහිප දෙනෙක් විය. දියණියන් අතරින් ජනප්‍රියත්වයට පත්වූ පාතිමා නම් දියණියව මහම්මත් විසින් තමා කුඩා කල හදාවඩාගත් ඔහුගේ මාමා වූ අබුතාලිබ්ගෙ පුතා වූ අලී නැමැත්තාට විවාහ කර දෙන ලදී.

මහම්මත්තුමා තරුණ වයසේ මුල් කාලයේ සිටම සිය සගයන්ට ආගමනුකූල ජීවිත ගත කිරීමට උපදෙස් දුන්නේය. ඔහුගේ සංචාරවලදී නිරතුරුව ඔහුට මුණගැසුණු යුදෙව්වන්ගේ සහ ක්‍රිස්තු භක්තිකයන්ගේ ඒකේෂ්වර අදහස් ඔහු කෙරෙහි දැඩි ලෙස බලපා ඇත. ඔහු ජීවිතයේ වැඩි කාලයක් භාවනාව සහ උපවාස කිරීම සඳහා මක්කම අසල හීරා කන්දට ගියේය. එසේ භාවනා කළ බොහෝ අවස්ථාවලදී ඔහු ධ්‍යානයට සමවැදී යම් යම් දේ ප්‍රකාශ කළ අතර ඔහුගේ ශිෂ්‍යයන් විසින් ඒවා වාර්තා කරන ලදී. එසේ වාර්තා කළ දෑ පසුව කුරාණයේ කොටස් ලෙස එයට ඇතුළත් කොට ඇත.



නබිතුමාගේ දෙවන විවාහය සව්දා නම් වැන්දඹුවක් සමඟ සිදුවන අතර ඒ වන විට තම කලින් බිරිඳ වූ කඩීජා මියගොස් තිබුණි. ඊට අමතරව තම තෙවන විවාහය ලෙස වයස වසර හයක අයේෂා සමඟ විවාහ වන අතර ඒ වන විට නබිගේ වයස වයස 53කි. අයේෂා යනු නබිගේ මිතුරා වූ අබුබකර්ගේ දුවයි. මේ වන විට නබිව හදාවඩාගත් මාමා සහ සීයා මියගොස්ය. නබි විසින් විවාහ කරගත් සියලුම කාන්තාවන් වැන්දඹුවන් වන අතර කඩීජා යනු දෙවරක් වැන්දඹුභාවයට පත් වූ කාන්තාවකි. නබිගේ පුත් ඊබ්‍රාහිම් හැර අනෙකුත් සියලුම ළමයින්ගේ මව් වන්නේ කඩීජාය. අයේෂාද නබි හා විවාහ වීමට පෙර ජුබෙයිර් හට විවාහ කර දී තිබුණි. අයේෂා සහ ඇගේ පියා වූ අබුබකර් ඉස්ලාම් ආගම වැළඳගැනීම නිසා එම විවාහය බිඳී ගොස් ඇය නබිතුමා සමඟ විවාහ විය.

නබිතුමාට පෙර සිටම අරාබි පාලන ක්‍රමය පුරාවටම බහු භාර්යා සේවනය පැවතුණි. නබිතුමාටද බිරින්දෑවරු 31ක් සිටි බව වාර්තා වේ. ඉන් 11-13ක් නිල බිරින්දෑවරුන්ද අනෙකුත් සියලුම දෙනා නිල නොවන තාවකාලික බිරිඳවන් සහ වහලියන් වශයෙන්ද සිට ඇත.

නබිතුමා සහ අයේෂා අඩු වයසින් විවාහ වීම මුස්ලිම්වරු දකින්නේ යහපත් ක්‍රියාවක් ලෙසයි. එයට හේතුව නම් නබිතුමා මියයාමෙන් පසුවද දෙවියන් විසින් එවූ පණිවුඩ ඇය හරහා ලබාගැනීමට හැකිවීමයි. දෙදෙනාම එක වයසේ සිටියා නම් දෙදෙනාම එක කාලයේ මියගොස් දෙවියන්ගේ පණිවිඩ ලබාගැනීමට කෙනෙකු නොමැති වීමට ඇති ඉඩ එයින් මගහැරුණු බව මුස්ලිම්වරුන්ගේ විශ්වාසයයි.

දෙවියන්ගෙන් තමාට ලැබුණු දිව්‍යමය පණිවිඩවල නියම ප්‍රතිඵල තමන්ට අවබෝධ වූ බව මහම්මද්තුමා වයස අවුරුදු 40දී පැවසීය. දෙවියන් වහන්සේ තෝරාගත් ශාස්තෘවරයා තමා බවත් ඒ නිසා තමාගෙන් ඉටු විය යුතු විශාල මෙහෙයක් ඇති බවත් පැවසීය. සර්වබලධාරී අල්ලා දෙවියන්ගේ පණිවිඩය අනුගාමිකයන් අතර ව්‍යාප්ත කිරීමේ විශාල කාර්යභාරය තමා වෙත පැවරී ඇති බව ඔහු පවසන ලදී. ඒ අනුව අල්ලා හැර වෙනත් දෙවියකු නොමැති බවත් එම දෙවියන්ගේ එකම ශාස්තෘවරයා වන්නේ මහම්මත් බවත් ඔහු ප්‍රකාශ කළේය. ඔහු ඉක්මණින් අනුගාමිකයන් කිහිපදෙනෙකු එකතු කරගත් අතර ඔහුගේ භාර්යාව, දියණිය, බෑණා සහ මිත්‍රයා වූ අබුබකර් ඒ අතර ප්‍රධාන වූහ.

නව ආගම ඉදිරිපත් කිරීමේදී එවකටත් මැදපෙරදිගට බලපෑමක් තිබූ කතෝලික සහ යුදෙව් ආගමිකයන්ගෙන් නව ආගමට එරෙහිව එන මතයන් වැළැක්වීම සඳහා නබිතුමා විසින් උපක්‍රම යොදාගන්නා ලදී. එනම්, යුදෙව් සහ කතෝලික ආගමේ මූලික සිද්ධාන්ත පිළිගැනීමත්, එකම දේවදූතයන් යොදාගැනීමත් සහ මොසස් සහ යේසුස්තුමා තමන්ට පෙර සිටි අල්ලා දෙවියන්ගේ ශාස්තෘවරුන් බවත් පැවසීමත්ය. නමුත් නබිතුමා අල්ලා දෙවියන්ගේ අවසන් ශාස්තෘවරයා බවද ඒ සමඟ පවසන ලදී.

කරක් ගහපු තැනක්

# අසාධාරණ අතීතයක් නිහඬවම දරාගත් උතුවන් කන්ද



ලංකා ඉතිහාසයේ වඩාත් අසාධාරණයට ලක්වූ විරුවෙක්ට සෙවණ දුන් කුඩා කඳුගැටයක් මාවනැල්ල නගරයට ආසන්නයේදී දකින්න ලැබෙනවා. සුදු ජාතිකයන්ට මං පහරන්නෙක් වුණත් අධිරාජ්‍යවාදයට විරුද්ධව සටන් කළ වීර තරුණයෙක් වූ සරදියෙල්ට එලෙස රැකවරණය දුන්නේ උතුවන්කන්දයි.

සොබාදහමේ අපූර්වතම නිර්මාණයක් වන මෙය ඉංග්‍රීසි ජාතිකයන් අතර ජනප්‍රිය වුනේ Castle Rock කියලා. ඈතට පෙනෙන හතරැස් හැඩති ගල්කුළු යුරෝපයේ පිහිටි බලකොටු සිහිගන්වන නිසා ඒ නමින් හඳුන්වන්නට ඇති. කොටස් දෙකක් විදිහට පෙනෙන කන්දේ උස ගල්කුල හඳුන්වන්නේ 'සරදියෙල් ගල' කියලයි.

නුවර දෙසට ගමන් කරන විට උතුවන් හන්දියෙන් කන්දට යන මාර්ගය දක්නට ලැබෙනවා. ඒ මාර්ගයේ 1-2kmක පමණ දුරක් ගමන් කිරීමෙන් කන්ද පාමුලට එන්න පුළුවන්. කන්දේ උස අඩි 1410ක් වගේ. කඳු නගින්නන් අතර උතුවන්කන්ද ඉතා ජනප්‍රියයි.


කඳු පාමුලට වෙනකන්ම වගේ පෞද්ගලික ඉඩම් පැතිරිලා තියෙන නිසා රබර් වගාවන්ද දැකිය හැකියි. කන්ද මධ්‍යය කුඩා වනවදුල්වලින් පිරිලා. පර්වත මුදුනට ළඟා වෙන්න කලින් දකුණු පසට වෙන්නට වැදගත් ස්ථානයක් දකින්නට ලැබෙනවා. ඒ තමයි සරදියෙල්ගේ වාසස්ථානය ලෙස සැලකෙන මහා ගල්කුලක් යට තියෙන 'සරදියෙල් ගුහාව'. මේ ගුහාවට ඇතුළු වෙනව නම් බඩගාගෙන තමයි යන්න වෙන්නෙ.

ගස් මුල්වලින් සහ ගල්වලින් සැදුනු මාර්ගයේ ඉදිරියට ගියාම හමුවෙන්නෙ ගල් තලාවක්. එම ගල් තලාවට ඉහළින් සරදියෙල් ගල පැහැදිලිවම පේනවා. ගල් තලාව තරණය කිරීමෙන් සරදියෙල් ගල පාමුලට යා හැකියි. කුඩා උසකදී වුවද අංශක 90ක තරමේ බෑවුමක් දකින්න ලැබෙන සරදියෙල් ගල නැගීම නම් තරමක අවදානම් කටයුත්තක්. කඳු මුදුනට බතලේගල කන්ද, අලගල්ල කන්ද මෙන්ම මාවනැල්ල ප්‍රදේශයේ කෙත්වතුද දැකගන්නට පුළුවන්.

කණගාටුවට කරුණ නම් ඝන අපද්‍රව්‍ය කන්දේ තැන තැන දමා තිබීමයි. සරදියෙල්ගේත් මේනකාගේත් නිකලැල් ආදරයට අපහාස නොකරමින් පරිසරයට ආදරය කරන ඔබ උතුවන් කන්ද තරණය කරනවා නම් ඒ පරිසරය විනාශ නොකළ යුතුයි. ගුණසේන විතාන මහත්මයා විසින් රචිත 'සරදියෙල්' පොතෙහි ඈතට පෙනෙන උතුවන් කන්ද පිළිබඳව සටහන් කරලා තියෙන්නේ මෙහෙම.

"කොළඹ නුවර පාරේ කෑගල්ලේ සිට සැතපුම් හයක් පමණ ගිය තැන, සුන්දරවත් - සාදරවත් පෙනෙන උතුවන්කන්ද තම පුතුගේ වියෝවෙන් සදා දුක්වෙන සරදියෙල්ගේ මව පිචෝහාමි, ඇන තියාගෙන බිම බලා සිටින්නා සේය".

ගයාන් තුදුස්ක



බොරැල්ල, සරණපාල හිමි මාවත, 45/95 බී, ස්ථානයේ පදිංචි බී. පුෂ්ප කුමාර වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.